# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,109 - 2019 පෙබරවාරි මස 01 වැනි සිකුරාදා - 2019.02.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 190 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 190 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 192 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 194 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 පෙබරවාරි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 පෙබරවාරි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

189 – B 081491 — 403 (2019/02)

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

MOD/DEF/HRM/SLN/COM 1.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ දිනය සංශෝධනය කිරීමක්

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවට බඳවා ගැනීමේ දිනය 1972 ජනවාරි මස 10 වැනි දින වශයෙන් සංශෝධනය කිරීම අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කර ඇත.

සන්දරගේ සොම්පාල හේමසිරි ප්‍රනාන්දු ශ්‍රීලංස්වේනාහ - එන්වීඑක්ස් 5011

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

හේමසිරි ප්‍රනාන්දු,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2019 ජනවාරි මස 14 වැනි දින,
කොළඹ දී ය.

02 - 165

## වෙනත් පත්කිරීම් ආදිය

2019 අංක 96

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

ගුවන් හමුදාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ෆ්ලයිට් ලෙෆ්ටිනන්ට් නිලයට උසස් කෙරේ.

ෆ්ලයිං ඔෆිසර් ජයසිංහ ආරච්චිගේ අකිලා ශ්‍රියන්ති විජේසිංහ (03739) වෛද්‍ය 2017.11.21

ෆ්ලයිං ඔෆිසර් ඉමදූව විතානගේ චතුර බුද්ධික (03504) ගු.තො.නි. 2018.03.14

ෆ්ලයිං ඔෆිසර් කුලතුංග මුදියන්සේලාගේ සම්පත් කුමාර කුලතුංග (03226) පරිපාලන 2018.04.14

ෆ්ලයිං ඔෆිසර් සේනානායක මුදියන්සේලාගේ සුපුන් ශාලින්ද ඔගස්ටින් ඉරුගල්බණ්ඩාර (03459) පරි/රෙජි 2018.04.25

ෆ්ලයිං ඔෆිසර් සීලමන් ගමරාලලාගේ කුමාරි අනුරුද්ධිකා (03496) පරි/තූර්ය 2018.05.14

ෆ්ලයිං ඔෆිසර් ලෝගනාතන් මතුරන්ගන් (03603) කාර්මික/ඉංජි 2018.06.29

ෆ්ලයිං ඔෆිසර් වැලිගොඩගේ සනෙත් සංක අබේවික්‍රම (03604) විද්‍යුත්/ඉංජි 2018.06.29

ෆ්ලයිං ඔෆිසර් අත්තනායක මුදියන්සේලාගේ නුවන් සමීර අත්තනායක (03605) තො.තා/ඉංජි 2018.06.29

ෆ්ලයිං ඔෆිසර් විජේසුන්දර මුදියන්සේලාගේ හිරෝෂන් බණ්ඩාරනායක (03606) විද්‍යුත්/ඉංජි 2018.06.29

ෆ්ලයිං ඔෆිසර් පැලැන්ද අප්පුහාමිලාගේ තිවංක ප්‍රමෝද් ජයසිංහ (03608) තො.තා/ඉංජි 2018.06.29

ෆ්ලයිං ඔෆිසර් නසීර් හිශාම් මොහෙම්මත් (03609) විද්‍යුත්/ඉංජි 2018.06.29

ෆ්ලයිං ඔෆිසර් මුණසිංහ ආරච්චිගේ දොන් අර්ජුන පසන් මුණසිංහ (03610) තො.තා/ඉංජි 2018.06.29

ෆ්ලයිං ඔෆිසර් හපුතන්ත්‍රී ගමගේ ලසිත පුෂ්පකුමාර (03611) තො.තා/ඉංජි 2018.06.29

ෆ්ලයිං ඔෆිසර් මදුරාගොඩ ගෙදර ප්‍රියන්කර සේනාරත්න (03612) තො.තා/ඉංජි 2018.06.29

ෆ්ලයිං ඔෆිසර් ඉසුරු චානක වීරසිංහ (03613) තො.තා/ඉංජි 2018.06.29

ෆ්ලයිං ඔෆිසර් අලුත් ගෙදර ලිලංග රුවන් අරබේවෙල (03615) සැපයුම් 2018.06.29

ෆ්ලයිං ඔෆිසර් හේෂාන් නුවංග කිරිවත්තුඩුව (03616) සැපයුම් 2018.06.29

ෆ්ලයිං ඔෆිසර් වැලිකෙටියේ ගෙදර වීරකොන් මුදියන්සේලාගේ ශ්‍රියන්ත කාවින්ද බණ්ඩාර වීරකොන් (03485) මෙහෙ/ගුවන් 2018.08.24

ෆ්ලයිං ඔෆිසර් රන්කිරි පතිරගේ නිසල සචින්ද පතිරන (03486) මෙහෙ/ගුවන් 2018.08.25

ෆ්ලයිං ඔෆිසර් හෙට්ටි ආරච්චිගේ සංඛ ජීවන්ත හෙට්ටිආරච්චි (03509) විද්‍යුත්/ඉංජි 2018.11.19

ෆ්ලයිං ඔෆිසර් නාකන්දලගේ සුනිමල් අසේල නාකන්දල (03510) විද්‍යුත්/ඉංජි 2018.11.19

ෆ්ලයිං ඔෆිසර් ගොඩගේ දිලීප් මධුශංක (03687) කාර්මික/ඉංජි 2018.12.14

කේ වී බී ජයම්පති,
ඩබ්ලිව්ඩබ්ලිව්වී,ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී (සිව්වරක්),
වීඑස්වී, යූඑස්පී. එම්එම්එස්සී (උපාය මාර්ගික
අධ්‍යයන - චීනය) එෆ්එන්ඩීයූ (චීනය), කිව්එච්අයි,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

2019 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

02 - 100/1

---

2019 අංක 97

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### ගුවන් හමුදාධිපතිතුමා විසින් අනුමත කරන ලද උසස් කිරීම්

පහත නම් සඳහන් නිලධාරීන් ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ෆ්ලයින් ඔෆිසර් නිලයට උසස් කෙරේ.

පයිලට් ඔෆිසර් වැඩිප්පුලි ආරච්චිගේ ට්‍රෙවීන් හේමිෂ් ආනන්ද (12006) වෛද්‍ය 2016.02.02

පයිලට් ඔෆිසර් හිරාන් ලක්දිමුතු කංකානම් පතිරණ (12007) වෛද්‍ය 2016.02.02

පයිලට් ඔෆිසර් සඳරු සරංජය ගයාන්ප්‍රිය ඌරල ලියනගේ (12008) වෛද්‍ය 2016.02.02

පයිලට් ඔෆිසර් ගලිම්බුරේ ගමරාලලාගේ ශාලිනී නදීජා (LOC/00641) වෛද්‍ය 2016.02.02

පයිලට් ඔෆිසර් ක්‍රාවේගේ යදීශ අනුරන්ග රත්නසිරි (11905) වෛද්‍ය 2016.02.02

පයිලට් ඔෆිසර් සුදුවැලි කොන්දගේ කළන දිල්ෂාන් (11982) කාර්මික/ඉංජි 2016.03.17

පයිලට් ඔෆිසර් දෙව්පුර දේවයලාගේ චතුර දිල්ශාන් රූපසිංහ (03685) විද්‍යුත්/ඉංජි 2017.02.08

පයිලට් ඔෆිසර් පස්කුවල්ගේ දොන් ප්‍රදීප් සුරන් බර්නාඩ් (12040) කාර්මික/ඉංජි 2017.03.16

පයිලට් ඔෆිසර් හේරත් මුදියන්සේලාගේ තිලින මධුසංඛ හේරත් (12041) කාර්මික/ඉංජි 2017.03.16

පයිලට් ඔෆිසර් කුරුකුලසූරියගේ දොන් ප්‍රමෝද් චින්තක කුරුකුලසූරිය (12042) කාර්මික/ඉංජි 2017.03.16

පයිලට් ඔෆිසර් මාලගොඩ ගමගේ මධුෂාන් රසංග මාලගොඩ (12043) කාර්මික/ඉංජි 2017.03.16

පයිලට් ඔෆිසර් විජේසිංහ ආරච්චිලාගේ ඩිවන්ත ශ්‍රීමාල් විජේසිංහ (12044) කාර්මික/ඉංජි 2017.03.16

පයිලට් ඔෆිසර් හෙට්ටි ආරච්චිගේ කසුන් සම්පත් ආටිගල (12045) විද්‍යුත්/ඉංජි 2017.03.16

පයිලට් ඔෆිසර් ඉලෙක්කුට්ටිගේ ෂෙහාන් ධනුෂ්ක ප්‍රනාන්දු (12046) විද්‍යුත්/ඉංජි 2017.03.16

පයිලට් ඔෆිසර් චතුර සහන් වික්‍රමතිලක මිදිගස්පෙ (12047) විද්‍යුත්/ඉංජි 2017.03.16

පයිලට් ඔෆිසර් අලුත් ගෙදර නුවන් බන්ඩාර ධර්මකීර්ති (12054) ගු.තො.නි. 2017.03.16

පයිලට් ඔෆිසර් හේරත් මුදියන්සේලාගේ ඉමිත්‍ර වරුණ බණ්ඩාර හේරත් (12055) ගු.තො.නි. 2017.03.16

පයිලට් ඔෆිසර් හේරත් මුදියන්සේලාගේ ක්‍රිෂාන් නාමල් මධුසංක හේරත් (12056) ගු.තො.නි. 2017.03.16

පයිලට් ඔෆිසර් ගැඩිවින්නෙ විතානගේ සිදත් සංජීව විතානගේ (12057) ගු.තො.නි. 2017.03.16

පයිලට් ඔෆිසර් වනසිංහ ආරච්චිගේ කවිදු සමිඥ වනසිංහ (12058) ගු.තො.නි 2017.03.16

පයිලට් ඔෆිසර් අමරසිංහ සිරිවර්ධන කෝරලගේ දොන් නිශ්චල් දිනුෂාන් අමරසිංහ (12101) සැපයුම් 2018.03.16

පයිලට් ඔෆිසර් සිසිර ගජදීරගේ සසික ප්‍රසන්න පෙරේරා (12102) පරි/රෙජි 2018.03.16

පයිලට් ඔෆිසර් පල්කුඹුරේ ජයසිංහලාගේ හෂාන් කාංචන මධුසංඛ සේනාධීර (12103) පරි/රෙජි 2018.03.16

පයිලට් ඔෆිසර් ප්‍රමෝද්‍ය ප්‍රසන් විතාරණ (12039) සැපයුම් 2018.03.16

පයිලට් ඔෆිසර් අගම්පොඩි ඉසුරු නිලංග (03742) ගු.තො.නි. 2018.06.23

පයිලට් ඔෆිසර් පල්ලේ ගේ රාල්ලාගේ තිලින රුවන් රත්නායක (03743) ගු.තො.නි. 2018.06.23

පයිලට් ඔෆිසර් විජේසිංහ පතිරණගේ අමිල චතුරංග විජේසිංහ (03744) ගු.තො.නි. 2018.06.23

පයිලට් ඔෆිසර් විදාන ගමගේ ප්‍රබෝධන සඳරුවන් (03745) ගු.තො.නි. 2018.06.23

පයිලට් ඔෆිසර් රිල්ලගොඩ ගමගේ චමත් කුසල් සෙනෙවිරත්න (03746) ගු.තො.නි. 2018.06.23

පයිලට් ඔෆිසර් ඩිංගිත්තා හේනේ ගෙදර සමීර කැලුම් හේවගේ (03549) විද්‍යුත්/ඉංජි 2018.10.26

කේ වී බී ජයම්පති,
ඩබ්ලිව්ඩබ්ලිව්වී,ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී (සිව්වරක්),
වීඑස්වී, යූඑස්පී. එම්එම්එස්සී (උපාය මාර්ගික
අධ්‍යයන - චීනය) එෆ්එන්ඩීයූ (චීනය), කිව්එච්අයි,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

2019 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ දී ය.

02 - 100/2

## රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/122/2018/පිටු/සැ.

### රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස්කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2019.02.01වැනි දින සිට 2019.02.15 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2019.02.22 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

එන්. සී. විතානගේ,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ කොට්ඨාසයේ 283 වෙළුමේ 224 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ජාවත්ත පාර, තිඹිරිගස්යායේ, වරිපනම් අංක 139හි පිහිටි ඉඩමට බලයලත් මානක ඊ. එම්. ඇන්තෝනිස් මහතා විසින් 1933.11.23 වැනි දින මැන සාදන ලද අංක 3314 දරන පිඹුරේ කැබලි අංක 'ඒ' සඳහා මායිම්,<br><br>උතුරට : වරිපනම් අංක 137, ජාවත්ත පාර අංක 97,<br>නැගෙනහිරට : වරිපනම් අංක 131, තිඹිරිගස්යාය පාර,<br>දකුණට : වරිපනම් අංක 141, ජාවත්ත පාර, අංක 101,<br>බස්නාහිරට : ජාවත්ත පාර.<br><br>බිම් ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 22.68 | 01. ජී. ඩී. ජයසුන්දර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1942.12.21 වැනි දින අංක 07 දරන විකුණුම්කරය.<br><br>02. සී. ඊ. ඒ. ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1952.03.06 වැනි දින අංක 332 දරන තෑගි ඔප්පුව. |

02 - 63

## ඉඩම් මැනුම් සභාව - ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ කටයුතු අමාත්‍යාංශය

### මිනින්දෝරුවරුන්ගේ ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය අවලංගු කිරීම/අත්හිටුවීම සහ වාර්ෂික බලපත්‍ර අත්හිටුවීම පිළිබඳව කරනු ලබන නිවේදනයයි

2002 අංක 17 දරන මැනුම් පනතේ 47 (1) (අ) වැනි වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මෙහි පහත උපලේඛන අංක (අ) හි නම් සඳහන් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ ලියාපදිංචිය එක් එක් නම ඉදිරියෙන් දක්වා ඇති දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කළ බවත්, එකී පනතේ 47 (1) (ආ) වැනි වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මෙහි පහත උපලේඛන අංක (ආ) හි නම් සඳහන් ලියාපදිංචි මිනිදෝරුවන්ගේ මැනුම් සභාවේ ලියාපදිංචිය එක් එක් නම ඉදිරියෙන් දක්වා ඇති කාල සීමාවන් සඳහා අත්හිටුවන ලද බවත් සහ එකී පනතේ 47 (1) (ඇ) වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මෙහි පහත දැක්වෙන උපලේඛන අංක (ඇ) හි නම් සඳහන් ලියාපදිංචි මිනින්දෝරුවරුන් වෙත නිකුත් කර තිබූ වාර්ෂික මැනුම් බලපත්‍ර එක් එක් නම් ඉදිරියෙන් දක්වා ඇති කාල සීමාවන් සඳහා අත්හිටුවන ලද බවත් මෙයින් දන්වනු ලැබේ.

**උපලේඛන අංක (අ)**

| ලියාපදිංචි අංකය | සම්පූර්ණ නම | ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය අවලංගු කළ දිනය |
|---|---|---|
| 19851781 | වඩු ආරච්චිගේ ප්‍රේමරත්න | 2019 සැප්තැම්බර් මස 01 |

**උපලේඛන අංක (ආ)**

| ලියාපදිංචි අංකය | සම්පූර්ණ නම | ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය අත්හිටුවන ලද කාල සීමාව |
|---|---|---|
| 19890150 | හපුගස්තැන්නගේ විජයතුංග | 2017.11.01 සිට 2018.10.31 දක්වා |

**උපලේඛන අංක (ඇ)**

| ලියාපදිංචි අංකය | සම්පූර්ණ නම | වාර්ෂික මැනුම් බලපත්‍රය අත්හිටුවන ලද කාල සීමාව |
|---|---|---|
| 20071660 | රොෂාන් දම්මික ලියනගේ | 2018.09.01 සිට 2019.02.28 දක්වා |
| 19900996 | පෙරුම්බදගේ ඉන්ද්‍රානි මල්ලිකා | 2018.11.15 සිට 2019.12.31 දක්වා |
| 20071268 | වලිමුනි දිසානායකලාගේ ශමිත් හිරංශ දිසානායක | 2018.09.01 සිට 2019.02.28 දක්වා |

පී. එම්. පී. උදයකාන්ත,
සභාපති,
ඉඩම් මැනුම් සභාව.

වර්ෂ 2018ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින,

02 - 331

---

## අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

### උපකෘත (ඉංග්‍රීසි) පාසල් ව්‍යවස්ථා මාලාව යටතේ විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා වන උපකෘත විශේෂ පාසල් හි නව පාසල් කළමනාකරුවන් පත් කිරීම පිළිබඳ නිවේදනය

| අනු. අංකය | උපකෘත විශේෂ පාසලේ නම | නව පාසල් කළමනාකරුගේ නම | පත්කිරීමට යෝජිත දිනය | පළාත | දිස්ත්‍රික්කය | අනුමත ශිෂ්‍ය ස්වභාවය |
|---|---|---|---|---|---|---|
| 01. | අනුරාධපුර උපකෘත විශේෂ පාසල | පී. ඒ. චන්ද්‍රසේකර මයා | 2016.06.11 | උතුරු මැද | අනුරාධපුර | දෘෂ්ටි හා ශ්‍රවණ ඌනතා |

| අනු. අංකය | උපකෘත විශේෂ පාසලේ නම | නව පාසල් කළමනාකරුගේ නම | පත්කිරීමට යෝජිත දිනය | පළාත | දිස්ත්‍රික්කය | අනුමත ශිෂ්‍ය ස්වභාවය |
|---|---|---|---|---|---|---|
| 02. | යා/නරීල්ඩ් උපකෘත විශේෂ පාසල | ජී. චාල්ස් මයා | 2015.07.23 | උතුරු | යාපනය | දෘෂ්ටි හා ශ්‍රවණ ඌනතා |
| 03. | බප/පිළි/රත්මලාන අන්ධ විද්‍යාලය | එන්. එම්. ද සිල්වා මයා | 2015.01.01 | බස්නාහිර | කොළඹ | දෘෂ්ටි ඌනතා |
| 04. | බප/පිළි/රත්මලාන බිහිරි විද්‍යාලය | එන්. එම්. වික්‍රමසිංහ මිය | 2014.01.29 | බස්නාහිර | කොළඹ | ශ්‍රවණ ඌනතා |
| 05. | බප/මීග/ශාන්ත ජෝශප් උපකෘත විශේෂ පාසල | ගරු අයිවන් පෙරේරා පියතුමා | 2015.05.11 | බස්නාහිර | ගම්පහ | ශ්‍රවණ ඌනතා |
| 06. | බප/ගම්/සුසිත සුවසෙත උපකෘත විශේෂ පාසල | මෙත්තානන්ද ධර්මරත්න මයා | 2016.11.19 | බස්නාහිර | ගම්පහ | දෘෂ්ටි, ශ්‍රවණ හා බුද්ධි ඌනතා |
| 07. | බප/මතු/මයුර උපකෘත විශේෂ පාසල | කේ. ඩී. සරත් ජයතිලක මයා | 2016.12.19 | බස්නාහිර | කළුතර | දෘෂ්ටි, ශ්‍රවණ හා බුද්ධි ඌනතා |
| 08. | මාර/රෝහණ උපකෘත විශේෂ පාසල | චන්ද්‍රසිරි හේවාකන්ධම්බි මයා | 2011.02.28 | දකුණ | මාතර | දෘෂ්ටි, ශ්‍රවණ හා බුද්ධි ඌනතා |
| 09. | හ/පොළොම්මාරුව උපකෘත විශේෂ පාසල සහ බ/සුදර්ශි උපකෘත විශේෂ පාසල | ඩබ්. ආර්. පෙරේරා මයා | 2011.03.06 | දකුණ | හම්බන්තොට, බදුල්ල | දෘෂ්ටි, ශ්‍රවණ හා බුද්ධි ඌනතා |

කේ. ඒ. ඩී. පුණ්‍යදාස,
අධ්‍යාපන අධ්‍යක්ෂ (නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන),
අධ්‍යාපන ලේකම් වෙනුවට.

2018 දෙසැම්බර් මස 26 වැනි දින,
මගේ අංකය : ED/9/18/07/04.
නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

02 - 97

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2018.07.09 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක විසින් සහතික කරන ලද 2011.12.28 දිනැති අංක 2244 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක විසින් සහතික කරන ලද 2015.02.12 දිනැති අංක 3328 දරන උකස් බැඳුම්කර අනුව 2018.06.19 වැනි දින තෙක් පොළිය ද, ස්ථිර අයිරා පහසුකම මත රුපියල් හැට නව ලක්ෂ දෙදහස් හයසිය තිහයි ශත දහහතරක (රු. 6,902,630.14) මුදල සමග ණය පහසුකම මත රුපියල් විසි නව ලක්ෂ පනස් තුන් දහස් හයසිය අටයි ශත හතළිස් පහක (රු. 2,953,608.45) මුදල සමග ස්ථිර අයිරා පහසුකමේ හිඟහිටි මුල් මුදල රුපියල් ලක්ෂ හැටක (රු. 6,000,000) මුදල මත වසරකට සියයට දහහත (17%) බැගින් 2018.01.09 වැනි දින සිට පොළිය ද ණය පහසුකමෙහි හිඟහිටි මුල් මුදල වන රුපියල් විසි පන් ලක්ෂ පහළොස් දහස් පන්සිය අසූවක (රු. 2,515,580) මුදල මත වසරකට සියයට දහසය (16%) බැගින් 2018.06.20 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පොළිය ද මැල්සිරිපුර, මහගම, අංක 16, ඒකනායක මුදියන්සේලාගේ සිසිර කුමාර ඒකනායක මහතා සහ සමරකෝන් මුදියන්සේලාගේ චන්දිමා ලක්මාලි සමරකෝන් මිය සහ අතපත්තු මුදියන්සේලාගේ රේණුකා කුමාරි ගුණතිලක මිය වෙතින් අයවිය යුතුව ඇත.

2. 2011.12.28 දිනැති අංක 2244 දරන උකස් බැඳුම්කරය සහ 2015.02.12 දිනැති අංක 3328 දරන උකස් බැඳුම්කර අනුව ස්ථිර අයිරා පහසුකම හා ණය පහසුකම මත අයවිය යුතු රුපියල් අනූ අට ලක්ෂ පනස්හය දහස් දෙසිය තිස් අටයි ශත පනස් නවයක (රු. 9,856,238.59) මුදලක් ද 2018.06.20 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට මහනුවර, ටොරින්ටන් පාරේ, අංක 24හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, මැල්සිරිපුර ශාඛාවේ ශාඛා කළමනාකරුහට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හැටහයේ කෝරළේ, හිරියාල හත්පත්තුවේ, ඉබ්බාගමුව ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 503, පුස්සැල්ලාගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වැටකෙයාපොත ග්‍රාමයේ පිහිටි කහටගහමුල හෙවත් පොල්ගහමුල ලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. විජයතුංග මහතා විසින් මැන සාදන ලද 2002.12.14 දිනැති අංක 1762 දරන පිඹුරෙහි ලොට් 7 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වූ එනම් එකී ලොට් 7ට උතුරු-නැගෙනහිරට : එකී අංක 1762 දරන පිඹුරෙහි ලොට් 8 ද, දකුණු-නැගෙනහිරට : මයිකල් හා වෙනත් අයට අයිති කුඹුර ද, දකුණට : ජේ. කේ. ජයකොඩි අප්පුහාමි හා වෙනත් අයට අයිති ඉඩමට ද, දකුණු-බටහිරට : එකී පිඹුරෙහි ලොට් 13, 12, 11,10, 9, සහ 6 ද, උතුරු-බටහිරට : ප්‍රධාන පාර ද මායිම් වූ රූඩ් තුනයි පර්චස් විසි දෙකයි දශම බිංදුවයි හතක් (අ. 0, රූ. 3, පර්. 22.07) විශාල බිම් ප්‍රමාණය සහ ඊට අයිති සැම සියලු දේ ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 863/124න් ඉදිරියට ගෙන ගිය පත් ඉරු අංක B 863/260 හි ලියාපදිංචි කර ඇත.

මෑතක දී සිදු කරන ලද මැනීමකට අනුව එකී ඉඩම පහත ආකාරයට විස්තර කොට ඇත.

ඉහත කී වැටකෙයාපොත ග්‍රාමයේ පිහිටි කහටගහමුල හෙවත් පොල්ගහමුල ලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. විජයතුංග මහතා විසින් මැන සාදන ලද 2011.10.07 දිනැති අංක 5001 දරන පිඹුරේ ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වූ එනම් එකී ලොට් 1ට උතුරු-නැගෙහිරට : එකී අංක 1762 දරන පිඹුරෙහි ලොට් 8 ද, දකුණු-නැගෙනහිරට : මයිකල්ට හා වෙනත් අයට අයිති කුඹුර ද, දකුණට : ජේ. ඒ. ජයකොඩි අප්පුහාමි සහ වෙනත් අයට අයිති ඉඩම ද, දකුණු-බටහිරට : එකී අංක 1762 දරන පිඹුරෙහි ලොට් 13, 12, 11, 10, 9 සහ 6 ද, උතුරු-බටහිරට : කුරුණෑගල සිට දඹුල්ලට ප්‍රධාන පාර ද මායිම් වූ රූඩ් තුනයි පර්චස් විසි දෙකයි දශම බිංදුවයි හතක් (අ. 0, රූ. 3, පර්. 22.07) විශාල බිම් ප්‍රමාණය සහ ඊට අයත් සැම සියලු දේ ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එස්. ඒ. හෙට්ටිආරච්චි මිය,
කළමනාකරු.

ලංකා බැංකුව,
මැල්සිරිපුර.

02 - 149

---

**ලංකා බැංකුව**

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම**

යාපනේ සිවන් පන්නෙන පාර, අංක 195හි පදිංචි බාලසුබ්‍රමනියම් වහීසන් මහතා සහ වහීසන් සුදර්ශිනී මහත්මිය යන අයගේ ණය වගකීම් වෙනුවෙන් උකස් කළ වත්තල, හැඳල, අල්විස් ටවුන් පාරේ අංක 112/06හි පිහිටි දේපළ.

2018.09.07 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. ඩබ්. තිලකරත්න විසින් සහතික කරන ලද 2012.02.27 දිනැති අංක 2080 දරන උකස් බැඳුම්කරයට අනුව 2018.06.22 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් හැට නව ලක්ෂ අසූ හය දහස් දෙසිය හැත්තෑ පහයි ශත විස්සක (රු. 6,986,275.20) මුදල සමග මුල් මුදලෙහි ශේෂය වන රුපියල් හැට ලක්ෂ හතළිස් නව දහස් හාරසිය එකොළහයි ශත පනස් හයක (රු. 6,049,411.56) මුදල මත වසරකට සියයට දහතුන (13%) බැගින් පොළියක් 2018.06.23 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් යාපනය, සිවන් පන්නෙන පාරේ, අංක 195හි බාලසුබ්‍රමනියම් වාහීසන් මයා සහ සුදර්ශිනි වාහීසන් මිය යන අයගෙන් එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. ඩබ්. තිලකරත්න විසින් සාදන ලද 2012.02.27 දිනැති එකී අංක 2080 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් හැට නව ලක්ෂ අසූ හය දහස් දෙසිය හැත්තෑ පහයි ශත විස්සක (රු. 6,986,275.20) මුදල සමග 2018.06.23 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු වසරකට 13.5% බැගින් පොළියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3 (50/3), ටී ඇන්ඩ් එච් ඔක්ෂන්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, වෙලනෙ ශාඛාවේ ශාඛා කළමනාකරුහට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දකුණු අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, නයාකන්ද දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවේ (හැඳල උප කාර්යාලය) හැඳල ග්‍රාමයේ පිහිටි අල්විස් නගරයෙහි වරිපනම් අංක 112/6 දරන "ගොරකගහතුඩුවෙවත්ත" නමැති ඉඩමට එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිල්ල සහ එහි ඇති සියල්ල ඇතුළත්ව පර්චස් විසි එකයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 21.80) ප්‍රමාණයකින් යුක්ත වන අතර එය බලයලත් මිනින්දෝරු හියු ආර්. සමරසිංහ විසින් සාදන ලද 2006 දෙසැම්බර් මස 23 දිනැති අංක 5032 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : අංක 1947 දරන පිඹුරෙහි ලොට් X ද, නැගෙනහිරට : පාර (අංක 243 දරන පිඹුරෙහි ලොට් 2D) ද, දකුණට : අංක 243 දරන පිඹුරෙහි ලොට් 2C ද, බස්නාහිරට : එච්. පෙමවතීට අයත් ඉඩම සහ පාර ද මායිම්ව එකී අංක 5032 දරන පිඹුරට අනුව එහි ඇති ගහකොළ, ගොඩනැගිලි හා සියලු දේ ද සමග පර්චස් විසි එකයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 21.80) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ B 117/58 හි ලියාපදිංචි කර ඇත.

එකී හැඳල ග්‍රාමයෙහි පිහිටි අල්විස් නගරය දිගට පිහිටි "ගොරකගහතුඩුවෙවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. එස්. ටී. පී. සේනාධීර විසින් සාදන ලද 1966 දෙසැම්බර් මස 01 දිනැති අංක 243 දරන ලොට් 2D ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2D ද, උතුරට : පාර ද, නැගෙනහිරට : අල්විස් නගරයෙහි වරිපනම් අංක 450 දරන පරිශ්‍රය ද, දකුණට : ලොට් 2C ද, බස්නාහිරට : ලොට් 2A ද, මායිම්ව අංක 1947 දරන එකී පිඹුරට අනුව පර්චස් හතරයි දශම නවයයි හතක (අ. 0, රූ. 0, පර්. 4.97) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වෙනත් සියලු දේ සමග වන අතර මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ B 1006/226හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

වී. වදනතීසන් මහතා,
ශාඛා කළමනාකරු.

2018 සැප්තැම්බර් මස 29 වැනි දින,
ලංකා බැංකුව,
වෙලනෙයි ශාඛාව.

02 - 146

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

හෙද ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්.
ගිණුම් අංකය : 1109025555.
ණය ගිණුම් අංකය : 2077415.

2018 ඔක්තෝබර් මස 30 වැනි දින පවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් K. V. A. D. C. K. විපුලසේන විසින් සහතික කරන ලද 2016 දෙසැම්බර් මස 16 වැනි දින අංක 1955 හා 2017 ජුනි මස 23 වැනි දින අංක 2101 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමින් වූ බැඳුම්කරයන් යටතේ (මෙහි පළවන උපලේඛනයේ වැඩි මනත්ව විස්තර වන දේපළ) පිළිමතලාව, කොළඹ පාර, අංක 239 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි හෙද ලංකා ප්‍රයිවෙට් ලිමිටඩ් බන්ධනදායි වශයෙන් හා ජානක ප්‍රසන්න ප්‍රේමචන්ද්‍ර උකස්කරු වශයෙන් හා මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් K. V. A. D. C. K. විපුලසේන විසින් සහතික කරන ලද 2017 ජුනි මස 23 වැනි දින අංක 2100 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරය යටතේ (මෙහි දෙවන උපලේඛනයේ වැඩි මනත්ව විස්තර වන දේපළ) පිළිමතලාව කොළඹ පාර අංක 239 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි හෙද ලංකා ප්‍රයිවෙට් ලිමිටඩ් බන්ධනදායි වශයෙන් ජානක ප්‍රසන්න ප්‍රේමචන්ද්‍ර උකස්කරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි පනස් නම ලක්ෂ එකොළොස්දහස් දෙසිය හයයි ශත තිස් අටක (රු. 25,911,206.38) මුදලක් 2018.07.20 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දෙකෝටි පනස් නම ලක්ෂ එකොළොස්දහස් දෙසිය හයයි ශත තිස් අටක (රු. 25,911,206.38) මුදල හා 2018.07.21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 19,582,900ක මුදලක් සඳහා වාර්ෂිකව 15.5% බැගින් වූ වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩුකර අයකර ගැනීම සඳහා එකී අංක 1955, 2101 සහ 2100 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස් කර ඇති මෙහි පහත 1 වන සහ 2 වන උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### 1 වන උපලේඛනය

1 මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහනුවර මහ නගර සභා සීමාවන් තුළ අංක 239, මහයියාව ග්‍රාම නිලධාරි වසම හි මහයියාව ගමේ පිහිටි පූර්ණවත්ත නමැති ඉඩමට (බලයලත් මානක R. C. O. De La Motte විසින් 1964 අගෝස්තු මස මැන සාදන ලද අංක 2682 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 30, 31 සහ 32 දරන එකට යාවූ ඉඩම නැවත මැන ඒකාබද්ධ කොට කරන ලද අතුරු බෙදීම) බලයලත් මානක සී. පාලමකුඹුර විසින් 2002.09.13 හා 2004.05.08 වැනි දින මැන සාදන ලද අංක 4174 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කල ලොට් 01 නමැති ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : ලොට් 2 සහ 3න් ද (මාර්ග ප්‍රවේශය), නැගෙනහිරට : ලොට් 03 (මාර්ග ප්‍රවේශය) සහ දොස්තර සී. ඩී. එල්. ප්‍රනාන්දු මාවත, දකුණට : දොස්තර සී. ඩී. එල්. ප්‍රනාන්දු මාවත හා පිඹුරු අංක 2682 සඳහන් පාර ද සහ බස්නාහිරට : ලොට් 02න් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය ඉහතකී පිඹුරු අංක 4174 අනුව පර්චස් දහහතරයි (අ. 0, රූ. 0, පර්. 14) නොහොත් හෙක්ටයාර් 0.0354 මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ A 595/65හි ලියාපදිංචි කර ඇත.

2 මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහනුවර මහ නගර සභා සීමාවන් තුළ අංක 239, මහයියාව ග්‍රාම නිලධාරි වසම හි මහයියාව ගමේ පිහිටි පූර්ණවත්ත නමැති ඉඩමට (බලයලත් මානක R. C. O. De LaMotte විසින් 1964 අගෝස්තු මස මැන සාදන ලද අංක 2682 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 30, 31 සහ 32 දරන එකට යාවූ ඉඩම නැවත මැන ඒකාබද්ධ කොට කරන ලද අතුරු බෙදීම) බලයලත් මානක සී. පාලමකුඹුර විසින් 2002.09.13 හා 2004.05.08 වැනි දින මැන සාදන ලද අංක 4174 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කල ලොට් 02 නමැති ඉඩම් කොටසට මායිම්, එනම් උතුරු නැගෙනහිරට : ඔරුකොටුදිවෙල්ල, නැගෙනහිරට : ඔරුකොටුදිවෙල්ල සහ ලොට් 01, දකුණට : මෙම ඉඩමේ කොටසක් වන පිඹුරු අංක 2682 සඳහන් ලොට් 29 සහ ලොට් 1 සහ 3 ද, බස්නාහිරට : කරව්ගහමුලහේන සහ කරව්ගහමුලහේන දැන් වරිපනම් අංක 70/4ජී පූර්නවත්ත දරන දේපළ උතුරු-බස්නාහිරට : ඔරුකොටුදිවෙල්ල යන මෙකී මායිම් තුළ පිහිටි ගොඩනැගිලි සහ ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය ඉහතකී පිඹුරු අංක 4174 දරන රූඩ් එකයි පර්චස් දෙකයි දශම එකයි නවයයි (අ. 0, රූ. 01, පර්. 2.19) නොහොත් 0.1067 හෙක්ටයාර් මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ A 599/95හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් විස්තර වන ඉඩම පොදුවේ සහ සම අයිතීන් ඇතිව උඩින් යටින් හා ඔස්සේ පාවිච්චි කිරීමේ අයිතීන් ද සමග,

ඉහත කී මහයියාව ගමේ පිහිටි පූර්ණවත්ත නමැති ඉඩමට බලයලත් මානක සී. පාලමකුඹුර විසින් 2002.09.13 හා 2004.05.08 වැනි දින මැන සාදන ලද අංක 4174 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 03 (මීටර් 3ක් මාර්ග ප්‍රවේශය සඳහා වෙන් කිරීම) නමැති ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : ඔරුකොටුදිවෙල්ල සහ ලොට් 02 න්ද, නැගෙනහිරට : ඔරුකොටුදිවෙල්ල සහ දොස්තර සී. ඩී. එල්. ප්‍රනාන්දු මාවත, දකුණට : දොස්තර සී. ඩී. එල්. ප්‍රනාන්දු මාවත සහ ලොට් 01 ද සහ බස්නාහිරට : ලොට් 1 සහ 2න් ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩමේ ප්‍රමාණය ඉහත කී පිඹුරු අංක 4174 අනුව පර්චස් තුනයි දශම අටයි එකයි (අ. 0, රූ. 0, පර්. 3.81) නොහොත් 0.0096 හෙක්ටාර් මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ A 531/08හි ලියාපදිංචි කර ඇත.

### 2 වන උපලේඛනය

1 මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහනුවර මහ නගර සභා සීමාවන් තුළ මාපනාවතුර ග්‍රාම නිලධාරි වසම හි මහයියාව ගමේ පිහිටි වරිපනම් අංක 249/10 කටුගස්තොට පාර දරන ඉඩමට බලයලත් මානක G. හීන්කෙන්ද විසින් 2003.03.19 වැනි දින මැන සාදන ලද අංක 2732 දරන පිඹුරේ සඳහන් ලොට් අංක 01ඒ දරන ඉඩමට මායිම් එනම් උතුරු නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් 01බී ද, දකුණු නැගෙනහිරට : ලොට් අංක 02 න් ද, දකුණට : කරව්ගහහේන ඉඩමේ දකුණු බාගයෙන් මෙකී පිඹුරේ ලොට් අංක 01 න් ද, බස්නාහිර : ඉහත කී පිඹුරේ ලොට් 01න් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් තුනයි දශම දෙකයි පහක්ව යයි (අ. 0, රූ. 0, පර්. 03.25) මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ A 275/279හි ලියාපදිංචි කර ඇත.

2 මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහනුවර මහ නගර සභා සීමාවන් තුළ මාපනාවතුර ග්‍රාම නිලධාරි වසම හි මහයියාව ගමේ පිහිටි ඔරුකොටුදිවෙල්ල නමැති ඉඩමට බලයලත් මානක G. හීන්කෙන්ද විසින් 2003.03.19 වැනි දින මැන සාදන ලද අංක 2732 දරන පිඹුරේ ලොට් 02 දරන ඉඩමට මායිම් එනම්, උතුරු නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් 02 ඒ ද, දකුණු නැගෙනහිරට : රාබත් විසින් හිමිකම් පාන ඉඩමෙන් ද, දකුණට : කරව්ගහහේන ඉඩමේ දකුණු බාගයෙන් සහ මෙකී පිඹුරේ ලොට් අංක 01න් ද, උතුරු-බස්නාහිරට : ඉහත කී පිඹුරේ ලොට් 01න් ද සහ බස්නාහිරට : ඉහත කී පිඹුරේ ලොට් 01න් ද යන මෙකී මායිම් තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් දාහතයි දශම නවයයි හයක් (අ. 0, රූ. 0, පර්. 17.96) මෙය මහනුවර ඉඩම් කාර්යාලයේ A 579/24හි ලියාපදිංචි කර ඇත.

පිඹුරු අංක 1309 සඳහන් ලොට් 4 දරන ඉඩම පොදුවේ සහ සම අයිතීන් ඇතිව උඩින් යටින් හා ඔස්සේ පාවිච්චි කිරීමේ අයිතීන්ද සමග,

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

02 - 124

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

හිදෙකි ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.
ගිණුම් අංකය : 1560340401.
ණය ගිණුම් අංක : 2096986 සහ 2252534.

2018 නොවැම්බර් මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. එන්. ද සිල්වා 1999 නොවැම්බර් මස 26 වැනි දින සහතික කරන ලද අංත 1023, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2007 මාර්තු මස 21 වැනි දින සහතික කරන ලද අංක 777 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2011 ජූනි මස 08 වැනි දින සහතික කරන ලද අංක 4353 දරන කලින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හිදෙකි ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ශ්‍රී ලංකාවේ නීති යටතේ නියම පරිදි සංස්ථාගත කළ සමාගමක් සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 7/1, ලිලී මාවත, කොළඹ 6හි තිබෙන ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දෙකෝටි පන් ලක්ෂ දහනව දහස් හයසිය හැත්තෑ අටයි ශත හැත්තෑ හතරක (රු. 20,519,678.74) මුදලක් 2018 අගෝස්තු මස 28 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දෙකෝටි පන් ලක්ෂ දහනව දහස් හයසිය හැත්තෑ අටයි ශත හැත්තෑ හතරක (රු. 20,519,678.74) මුදල අය කර ගැනීම සඳහා සහ 2018 අගෝස්තු මස 29 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 6,634,707.71ක මුදලක් මත රු. 6,500,000 දක්වා වර්ෂයකට 7% බැගින් සහ වැඩි මනත් ප්‍රමාණය වර්ෂයකට 28% බැගින් සහ රු. 13,532,800ක මුදලක් මත වර්ෂයකට 14.44% බැගින් (වර්ෂයකට PLR + 3%) වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩු කොට එකී අංක 1023, 777 සහ 4353 දරන බැඳුම්කර මගින් කලින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් ලෙස හඳුන්වනු ලැබූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝර්ප් වීදියේ 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුශූණලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ ඩි. ආර්. ඕ ගේ කොට්ඨාසය තුළ කොළඹ මහා නගර සභා සීමා ඇතුළත කොට්ඨාසය, අංක 36 (කුරුඳුවත්ත) තුළ පිහිටි බලයලත් මිනින්දෝරු සහ මට්ටම්කරු එම්. එස්. ටී. පී. සේනාධීර විසින් 1995 ජනවාරි මස 31 වැනි දින පිළියෙල කරන ලද අංක 1917 දරන නිවාස සංකීර්ණ පිඹුරෙන් දක්වෙන සර් අර්නස්ට් ද සිල්වා මාවතේ, වරිපනම් අංක 61 7/3, දරන ඒකක අංක 39 ලොට් 39 හත්වන තට්ටුව සහ එකී අංක 1917 දරන නිවාස සංකීර්ණ පිඹුර ප්‍රකාරව එකී ඒකක අංක 39 ලොට් 39 ට මායිම් වශයෙන්, උතුරට : මෙම කැබැල්ල වෙන් කරන මෙම කැබැල්ල හි උතුරු බිත්තියේ මධ්‍යය න් ද සහ ඒකක 38 ලොට් 38 හි ඒ6 සළකුණු කරන ලද කොරිඩෝව න් ද සහ ඩී7කේ සළකුණු කරන ලද නළය න් ද, නැගෙනහිරට : මෙම කැබැල්ල වෙන් කරන මෙම කැබැල්ල හි නැගෙනහිර බිත්තියේ මධ්‍යය න් ද සහ ඩී7කේ සළකුණු කරන ලද නළය න් ද, දකුණට : මෙම කැබැල්ල වෙන් කරන මෙම කැබැල්ල හි දකුණු බිත්තියේ මධ්‍යය න් ද සහ වයි6 සළකුණු කරන ලද උප ශාලාව, සෝපානය සහ තරප්පු මාර්ගය න් ද සහ බස්නාහිරට : මෙම කැබැල්ල වෙන් කරන මෙම කැබැල්ල හි බස්නාහිර බිත්තියේ මධ්‍යය න් ද සහ ඒ6 සළකුණු කරන ලද කොරිඩෝව, ඩී7කේ සළකුණු කරන ලද නළය සහ මෙම කැබැල්ල හි පැතලි වහලයේ මධ්‍යය අසලින් ඉතා උස්තැනට සහ මෙම කැබැල්ලහි මහලේ මධ්‍යය අසලින් ඉතා පහත් තැනට වයි6 සළකුණු කරන ලද උප ශාලාව, සෝපානය සහ තරප්පු මාර්ගයන් ද මායිම් වූ එකී නිවාස සංකීර්ණ අංක 1917 දරන පිඹුර ප්‍රකාරව වර්ග අඩි එක්දහස් පන්සිය විසිපහයි (වර්ග අඩි 1525)ක විශාලත්වයෙන් වූ ඉඩම වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරුව/වෙළුම Con A 68/278 යටතේ ලියාපදිංචි කර ඇත.

පොදු මූල ද්‍රව්‍ය සියයට බින්දුවයි දෙකයි දශම තුනයි දෙක (02.32%)ක කොටසට අයිතිවාසිකම් සමග එකට වේ.

පහත දක්වෙන නිවාස සංකීර්න දේපලට එන එකී නිවාස සංකීර්ණ ඒකකය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ ඩි. ආර්. ඕ. ගේ කොට්ඨාසය තුළ කොළඹ මහා නගර සභා සීමා ඇතුළත කොට්ඨාසය, අංක 36 (කුරුඳුවත්ත) තුළ පිහිටි සර් අර්නස්ට් ද සිල්වා මාවතේ වත්මන් වරිපනම් අංක 61, 61ඒ, 61 1/1 සිට 61 1/8 දක්වා, 61 2/5, 61 2/6, 61 3/1 සිට 61 3/8 දක්වා, 61 4/5, 61 4/6, 61 4/8, 61 5/1 සිට 61 5/8 දක්වා, 61 6/5, 61 6/6, 61 6/8 සහ 61 7/1 සිට 61 7/4 දක්වා දරන 1994 නොවැම්බර් මස 23 වැනි දින අංක 1911 දරන පිඹුරේ දක්වෙන ලොට් 2හි නැවත මැනීමක් වන බලයලත් මිනින්දෝරු සහ මට්ටම්කරු එම්. එස්. ටී. පී. සේනාධීර විසින් 1995 ජනවාරි මස 31 වැනි දින පිළියෙල කරන ලද අංක 1917 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2 වශයෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : සර් අර්නස්ට් ද සිල්වා මාවතේ අංක 59 දරන පරිශ්‍රයෙන් ද, නැගෙනහිරට : අංක 3 සහ අංක 1, 1 1/2, 1 2/1 සහ 1 2/2 දරන පරිශ්‍ර මගින් ද, කේම්බ්‍රිජ් ටෙරස් සහ අංක 32, කේම්බ්‍රිජ් පෙදෙසෙ න් ද, දකුණට : අංක 28 සහ 32 දරන පරිශ්‍ර මගින් ද, කේම්බ්‍රිජ් පෙදෙස සහ අංක 65, අර්නස්ට් ද සිල්වා මාවත ද සහ බස්නාහිරට : සර් අර්නස්ට් ද සිල්වා මාවතෙන් ද මායිම් වූ එකී අංක 1917 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දාහතරයි දශම හයයි අටක (අ. 0, රූ. 1, පර්. 14.68) විශාලත්වයෙන් වූ ඉඩම වේ.

පහත දක්වෙන පොදු මූලද්‍රව්‍ය සමග එකට

(3) පොදු මූල ද්‍රව්‍ය :

1. ඒ. ගොඩනැගිල්ල තිබෙන ඉඩම
   බී. එම ඉඩමේ ඉතිරි කොටස

2. අත්තිවාරම්, බීම්, බාල්ක, ආධාරක, කාණු, කසල කාණු, මනුබිල්, ට්‍රාන්ස්ෆෝමරයේ සිට මීටර් දක්වා විදුලි රැහැන්, ජව මූලික සිට මීටර් දක්වා ජල නළ, සෝපාන, තරප්පු මාර්ග, උප ශාලා, නළ, කොරිඩෝර්, ආරක්ෂක කාමරය, ගිනි දල්වන උපකරණය, ළඟ ඇති ජෙනරේටරය, වතුර වල, මුදුනෙහි වූ පොම්ප ටැංකි, කුරුසි සුරුවම, වත්ත, සීමා බිත්ති, වහලය සහ ඒකක 1 ලොට් 1.

3. ඉහත විස්තර කරන ලද ප්‍රදේශ ඒ හැර ගොඩනැගිල්ලේ අනිත් සියලුම ව්‍යුහ

4. ඒකක 3 සිට 39 දක්වා පොදු භාවිතයට වෙන් කරන ලද පීඑල් 1 සිට පීඑල් 37 දක්වා ලොට්ස් සළකුණු කරන ලද රිය ගාල.

බලයලත් මිනින්දෝරු එම්. එස්. ටී. පී. සේනාධීර විසින් 1995 ජනවාරි මස 31 වැනි දින පිළියෙල කරන ලද අංක 1917 දරන නිවාස සංකීර්න පිඹුරට අනුව වේ.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

02 - 130

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

පූජිත තුමල් අලහකෝන් වික්‍රමරත්න.
ණය ගිණුම් අංක : 2142411.

2018 නොවැම්බර් මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

මොරවක ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. අබේවික්‍රම විසින් 2010 මැයි මස 5 වැනි දින සහතික කරන ලද අංක 1431 සහ 2013 ජනවාරි මස 4 වැනි දින සහතික කරන ලද අංක 2539 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2015 මාර්තු මස 25 වැනි දින සහතික කරන ලද අංක 2653 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පූජිත තුමල් අලහකෝන් වික්‍රමරත්න ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක් කෝටි අසූහතර ලක්ෂ අසූ තුන් දහස් තුන්සිය හැට අටයි ශත හැට තුනක (රු. 18,483,368.63) මුදලක් 2018 ඔක්තෝබර් මස 25 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක් කෝටි අසූහතර ලක්ෂ අසූ තුන් දහස් තුන්සිය හැට අටයි ශත හැට තුනක (රු. 18,483,368.63) මුදල අය කර ගැනීම සඳහා සහ 2018 ඔක්තෝබර් මස 26 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 17,450,000ක මුදලක් සඳහා 16.00% වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් හා වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් මුදලක්වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 1431, 2539 සහ 2653 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ඩ්‍රොප් වීදියේ 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥණලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

1. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුල් කෝරළේ, මැද පත්තුවේ, කලවාන ප්‍රාදේශීය සභා සීමා ඇතුළත සමන්පුර ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසය සහ කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත පෙදිකන්ද හි පිහිටි "නිව් රජ්ජුරුවත්ත එස්ටේට්" නමැති දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එස්. සිරිවර්ධන විසින් 2005.11.19 වැනි දින මැන සාදන ලද අංක 1807 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් බී වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් ඒ මගින් ද, නැගෙනහිරට : රාජ්‍ය ඉඩම මගින් ද, දකුණට : ආර්. ඒ. ඩින්ගිරි මහත්මයාට හිමිකම් කියන ලද කුඹුර සහ දොළ සඳහා වෙන් කිරීම මගින් ද සහ බස්නාහිරට : පිඹුර සිට කලවාන දක්වා ප්‍රධාන පාර සහ රජ්ජුරුවත්ත එස්ටේට් හි ඉතිරි කොටස මගින් ද මායිම් වූ එකී අංක 1807 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකොළහයි රූඩ්ස් තුනයි පර්චස් තිස් තුනක (අ. 11, රු. 3, පර්. 33) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පතඉරුව සී 282/84 යටතේ ලියාපදිංචි කර ඇත.

2. සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුල් කෝරළේ, මැද පත්තුවේ, කලවාන ප්‍රාදේශීය සභා සීමා ඇතුළත සමන්පුර ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසය සහ කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත පෙදිකන්ද හි පිහිටි "නිව් රජ්ජුරුවත්ත එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එස්. සිරිවර්ධන විසින් 2005.11.19 වැනි දින මැන සාදන ලද අංක 1807 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් සී වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : දොළ සඳහා වෙන් කිරීම මගින් ද, නැගෙනහිරට : රාජ්‍ය ඉඩම සහ රජ්ජුරුවත්ත එස්ටේට් හි ඉතිරි කොටස මගින් ද, දකුණට : ආර්. ඒ. ඩින්ගිරි මහත්මයාට හිමිකම් කියන ලද කුඹුර සහ දොළ සඳහා වෙන්කිරීම මගින් ද සහ බස්නාහිරට : රජ්ජුරුවත්ත එස්ටේට් හි ඉතිරි කොටස, කුඹුර සහ ගම්වැසියන් විසින් හිමිකම් කියන ලද හේන මගින් ද මායිම් වූ එකී අංක 1807 දරන පිඹුර ප්‍රකාරව අක්කර අටයි රූඩ්ස් තුනයි පර්චස්

දොළහක (අ. 8, රූ. 3, පර්. 12) විශාලත්වයෙන්වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියල දේත් සමග වන මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම/පත්ඉරුව සී 282/85 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනි ගමගේ මිය,
සමාගම් ලේකම්.

2018 නොවැම්බර් මස 30 වැනි දින.

02 - 131

---

## මහජන බැංකුව - ගොඩකවෙල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.12.18 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් දර්ශනී දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2014.09.17 දිනැති අංක 1371 දරන උකස්කරය හා ප්‍රසිද්ධ නොතාරිස් සකුලා ප්‍රජාපතී කුමාරනායක මහත්මිය විසින් ලියා සහතික කරන ලද 2017.05.09 දිනැති අංක 126 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම. කහගලගේ සිරිමෙවන් දර්ශන වීරසිංහ යන අය විසින් පැහැර ඇති බැවින්ද, එකී උකස්කර යටතේ දැනට පිළිවෙලින් රුපියල් තිස්හතර ලක්ෂ අසූ පන් දහස් එකසිය තුනයි ශත නමයක (රු. 3,485,103.09) මුදලක් සහ රුපියල් අනූ පන් ලක්ෂ දහනම දහස් නවසිය අනූ නමයක (රු. 9,519,999) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, එකී මුදල මත පිළිවෙලින් 2018.06.16 සහ 2018.07.12 වැනි දින සිට වර්ෂයකට බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතය + සියයට හතයි දශම පහ (AWPLR + 7.5%) සහ මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතය + සියයට හයයි දශම පහ (Monthly AWPLR + 6.5%) බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ "29එල්" (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තිස්හතර ලක්ෂ අසූ පන් දහස් එකසිය තුනයි ශත නමයක (රු. 3,485,103.19) මුදලක් සහ රුපියල් අනූ පන් ලක්ෂ දහනම දහස් නවසිය අනූ නමයක (රු. 9,519,999) මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් එකී අංක 1371 හා 126 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, මැද පත්තුවේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩකවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ, ගොඩකවෙල ග්‍රාමසේවක වසමේ, ගොඩකවෙල ගමේ පිහිටි "වැවේහේනවත්ත හෙවත් වැවේවත්ත" නමැති අවසරලත් මානක එම්. එම්. ඩී. එස්. ශාන්ත මහතා විසින් 2016.09.01 වැනි දින මැන සම්පාදිත අංක 6754 පිඹුරේ සඳහන් උතුරට : පාර ද, නැගෙනහිරට : එස්. පී. ඒකනායකට අයිති ඉඩම ද, දකුණට : රජයේ ඉඩම ද, බස්නාහිරට : පිඹුරු අංක 1817හි කැබලි අංක 1 (පාර) සහ කැබලි අංක 4 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් විස්සක් (අ. 0, රූ. 01, පර්. 20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ. පළතුරු ආදී සියලුම දේද වේ.

ඉහත ඉඩම පහත ඉඩම් කැබලි දෙක ඒකාබද්ධ කර නැවත මැනීමකි.

1. සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, මැද පත්තුවේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩකවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ, ගොඩකවෙල ග්‍රාමසේවක වසමේ, ගොඩකවෙල ගමේ පිහිටි "වැවේහේනවත්ත හෙවත් වැවේවත්ත" නමැති අවසරලත් මානක ඒ. ඊ. සී. ප්‍රනාන්දු මහතාගේ 1991.06.21 දිනැති අංක 1817 දරන පිඹුරේ කැබලි අංක 02 (බලයලත් මානක එම්. එම්. ඩී. එස්. ශාන්ත මහතා විසින් 1999.11.29 දිනැතිව සත්‍ය උද්ධෘතයක් බවට තහවුරු කර ඇත.) ලෙස සඳහන් උතුරට : පාර ද, නැගෙනහිරට : එස්. පී. ඒකනායකට අයිති ඉඩම ද, දකුණට : කැබලි අංක 3 සහ 1 ද, බස්නාහිරට : කැබලි අංක 1 ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකක් (අ. 0, රූ. 01, පර්. 0) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ. පළතුරු ආදී සියලුම දේද වේ.

මෙය දැනට ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 06/110 දරන පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

2. සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, අටකලන් කෝරළේ, මැද පත්තුවේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගොඩකවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ, ගොඩකවෙල ග්‍රාමසේවක වසමේ, ගොඩකවෙල ගමේ පිහිටි "වැවේහේනවත්ත හෙවත් වැවේවත්ත" නමැති අවසරලත් මානක ඒ. ඊ. සී. ප්‍රනාන්දු මහතාගේ 1991.06.21 දිනැති අංක 1817 දරන පිඹුරේ කැබලි අංක 03 (බලයලත් මානක එම්. එම්. ඩී. එස්. ශාන්ත මහතා විසින් 1997.09.22 දිනැතිව සත්‍ය උද්ධෘතයක් බවට තහවුරු කර ඇත.) ලෙස සඳහන් උතුරට : කැබලි අංක 2 ද, නැගෙනහිරට : එස්. පී. ඒකනායකට අයිති ඉඩම ද, දකුණට : රජයේ ඉඩම ද, බස්නාහිරට : කැබලි අංක 4 සහ 1 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ඇදී සියලුම දේද එම ඉඩමට යාමට සහ ඒමට ඇති සියලුම මාර්ගයන්හි මාර්ග පරවශ්‍යතා අයිතිය ද සමග වේ.

මෙය දැනට ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 20/105 දරන පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බී. එම්. ඩබ්. කොඩිතුවක්කු,
ප්‍රාදේශීය කළමනාකාරිණී,
රත්නපුර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නව නරගය,
රත්නපුර.

02 - 145

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2018.12.06 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් හේවාපේඩිගේ සුරේකා මිහිරන්ති විජේවර්ධන විසින් සහතික කරන ලද 2018.08.08 දිනැති අංක 424, 425 සහ 426 දරන උකස් බැඳුම්කරය අනුව 2018.10.30 වැනි දින තෙක් 1 වන ණය මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් පන්කෝටි හැට දෙලක්ෂ තිස් දහස් තුන්සිය හතළිස් දෙකයි ශත හතළිස් හතක (රු. 56,230,342.47) මුදල සමග රුපියල් පන්කෝටි පනස් ලක්ෂයක (රු. 55,000,000) මුදල මත 2018.10.31 වැනි දින සිට වසරකට සියයට නවයයි දශම පහ (9.5%) බැගින් තව දුරටත් පොළියක් ද 2018.10.30 දක්වා 2 වන ණය මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් හාර කෝටි පනස් හය ලක්ෂ අසූ දෙදහස් තුන්සිය අනූහතයි ශත විසිහයක (රු. 45,682,397.26) මුදලක් සමග රුපියල් හාර කෝටි පනස් ලක්ෂයක (රු. 45,000,000) මුදල මත වර්ෂයකට සියයට හයයි දශම හතයි පහ (6.75%) බැගින් 2018.10.31 වැනි සිට තව දුරටත් පොළිය ද, 3 වන ණය මුදල මත 2018.10.30 වැනි දින දක්වා මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් අසූ එක් ලක්ෂ හැත්තෑ නව දහස් හත්සිය හතරයි ශත එකක (රු. 8,179,704.01) මුදල සහ රුපියල් ලක්ෂ අසූවක (රු. 8,000,000) මුදල මත වසරකට සියය නවයයි දශම පහ (9.5%) බැගින් 2018.10.31 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පොළිය ද, කඩවත, මහර, මීහිඳු මාවත, අංක 222/2/2හි පිහිටි ජයලංකා ගාමන්ට් හි අයිතිකරු කඩවත, මහර, මීහිඳු මාවත, අංක 222/2/3 හි පදිංචි පුවක්ගොල්ලගේ ප්‍රදීප් චන්දන ජයලංකා මහතා යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. එකී අංක 424, 425 සහ 426 දරන උකස් බැඳුම්කර අනුව (1) වන ණය මත අයවිය යුතු රුපියල් පන්කෝටි හැට දෙලක්ෂ තිස් දහස් තුන්සිය හතළිස් දෙකයි ශත හතළිස් හතක (රු. 56,230,342.47) 2 වන ණය මුදල මත අයවිය යුතු රුපියල් හාර කෝටි පනස් හය ලක්ෂ අසූ දෙදහස් තුන්සිය අනූහතයි ශත විසිහයක (රු. 45,682,397.26) සහ 3 වන ණය මුදල මත අයවිය යුතු රුපියල් අසූ එක් ලක්ෂ හැත්තෑ නව දහස් හත්සිය හතරයි ශත එකක (රු. 8,179,704.01) මුදල සමග 2018.10.31 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, කිරිබත්ගොඩ ශාඛාවේ ශාඛා කළමනාකරුහට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, දෙවමැද්දේ කෝරළේ, වාරියපොල ප්‍රාදේශීය සභා සීමාවේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, විලාකටුපොත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, විලාකටුපොත පිහිටා ඇති "අඹගහමුලවත්ත"

නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. අතපත්තු විසින් සාදන ලද 2016 මාර්තු මස 24 දිනැති අංක 2016/15B දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 ඊසානට : බලයලත් මිනින්දෝරු ඒ. අතපත්තු විසින් සාදන ලද 1991 ඔක්තෝබර් මස 22 දිනැති අංක 90/91 දරන පිඹුරෙහි ලොට් 10C1 සහ ලොට් 10B (ප්‍රවේශය) ද, ගිනිකොණට : කලින් ජේ. ඒ. ශ්‍රේස්නෝනා අයිතිවාසිකම් කියූ හේමචන්ද්‍ර අයිතිවාසිකම් කියන ඉඩම ද, බස්නාහිරට : ඒ. ඩී. එන්. ගුණසේකර අයිතිවාසිකම් කියන බලයලත් මිනින්දෝරු ඒ. අතපත්තු විසින් සාදන ලද 1991 ඔක්තෝබර් මස 22 දිනැති අංක 90/91 දරන පිඹුරෙහි ලොට් 11 ද, වයඹට : බලයලත් මිනින්දෝරු ඒ. අතපත්තු විසින් සාදන ලද 1991 ඔක්තෝබර් මස 22 දිනැති අංක 90/91 දරන පිඹුරෙහි ලොට් 11 ද මායිම්ව එකී අංක 2016/15B පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් තිස් හතයි දශම තුනක (අ. 0, රූ. 2, පර්. 37.3) හෙවත් හෙක්ටයාර 0.2967ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ S 95/110 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙයට බලයලත් මිනින්දෝරු ඒ. අතපත්තු විසින් සාදන ලද 1991 ඔක්තෝබර් මස 22 දිනැති අංක 90/91 දරන පිඹුරෙහි ලොට් 10B මතින් හා ඒ දිගට පාරේ අයිතිය ද ඇත.

### දෙවන උපලේඛනය

ඉහත පළමු උපලේඛනයේ පූර්ණ වශයෙන් විස්තර කර ඇති ඉඩමට හා පරිශ්‍රයට සවිකර ඇති යන්ත්‍ර සූත්‍ර හා යන්ත්‍රාගාර පහත සඳහන් සියල්ලෙන් සමන්විත වේ.

| *No.* | *Description* | *Age* | *Origin* | *Unit* |
|---|---|---|---|---|
| 1. | Complete set of the spreading machine with 8 Nos. Vacuum tables and Stands (HYP 3-3) | 1 | China | 1 |
| 2. | Computerized bar tacking machine (HK 2900SS) | 1 | China | 10 |
| 3. | Computerized buttoning machine (HK 2903S-301) | 1 | China | 1 |
| 4. | Electronic button sewer for woven fabric (HBH 1790S) | 1 | China | 2 |
| 5. | Computerized drive high speed lockstitch machine (rotary knife build-in control box) thread trimming & reverse stitching and clip device (H 8800EW-7C-5/AK) | 1 | China | 23 |
| 6. | Needle feed direct drive computerized lockstitch machine with auto thread trimmer (needle bar semi-dry thread trimming & reverse stitching and thread wiper) (H 9120S-7C-3/AK) | 1 | China | 4 |
| 7. | Direct drive computerized single needle lockstitch machine with cutter (rotary knife) thread trimming & reverse stitching foot lifter (H 8880C-7C-2/AK) | 1 | China | 2 |
| 8. | Direct drive computerized single needle lockstitch machine with cutter (rotary knife) thread trimming & reverse stitching foot lifter (HT 9220 TA - 7C - 3/AK) | 1 | China | 2 |
| 9. | Direct drive super high speed 6 thread overclock machine pneumatic, flat suction auto trimmer + suction + presser foot lifter (HX6818TC03UTC2) | 1 | China | 11 |
| | **Cutter Machine** | | | |
| 10. | Toyo | 15 | Japan | 1 |
| 11. | Estman | 15 | Japan | 1 |

| *No.* | *Description* | *Age* | *Origin* | *Unit* |
|---|---|---|---|---|
| | Fusing Machine | | | |
| 12. | Oshima (450NS) | 15 | American | 1 |
| | **Iron Tabels** | | | |
| 13. | Nero Tabels | 15 | China | 4 |
| 14. | Flat Tabels | 15 | China | 6 |
| | **Iron Broilar** | | | |
| 15. | 12KV - 15DQ2646 | 15 | China | 1 |
| 16. | 12KV - 15DQ2746 | 15 | China | 1 |
| 17. | 6KV | 15 | China | 1 |
| | **Over Lock** | | | |
| 18. | Juki | 15 | Japan | 17 |
| 19. | Siruba | 15 | China | 3 |
| 20. | Precolus | 15 | China | 3 |
| 21. | Pretlons | 15 | China | 1 |
| | **Single Needle** | | | |
| 22. | Juki | 15 | Japan | 75 |
| 23. | Preclous - PC 8520 | 15 | China | 1 |
| 24. | Senben - 5002 | 15 | China | 1 |
| 25. | Zoje - 7000223 | 15 | China | 1 |
| | **Button Holder** | | | |
| 26. | Juki | 15 | Japan | 2 |
| 27. | Kansai Special - 1 | 15 | Japan | 4 |
| 28. | Kansai Special - 2 | 15 | Japan | 1 |
| 29. | Button Attach - Juki - LK1903ASS | 15 | Japan | 1 |
| 30. | Button Attach - Juki - Kozf13720 | 15 | Japan | 1 |
| 31. | Button Attach - brother - M0585182 | 15 | China | 2 |
| 32. | Bar Tag - Brother - Ke-430F-03 | 15 | China | 1 |
| | **Pidok Arm** | | | |
| 33. | Sicama - OTA926SP | 15 | China | 2 |
| 34. | Juki | 15 | Japan | 5 |
| 35. | Juki Double Needle | 15 | Japan | 13 |
| | Flat Lock | | | |
| 36. | Pegasus | 15 | China | 5 |

| No. | Description | Age | Origin | Unit |
|---|---|---|---|---|
| 37. | Brother-LGI-212 | 15 | Japan | 1 |
| 38. | Precl ous B/Hem | 15 | China | 3 |
| 39. | Thread Sucker Machine | 15 | Japan | 1 |
| 40. | Welt Pkt Machine - APW235 | 15 | Japan | 1 |
| 41. | Juki Ilathole - AS 900C | 15 | Japan | 1 |

මේ සමග ඉහත පළමු උපලේඛනයෙහි පූර්ණ වශයෙන් විස්තර කර ඇති ඉඩමට හා පරිශ්‍රයට සවිකර ඇති සහ කුමන ආකාරයකට හෝ විස්තර කර ඇති අනෙක් සියල්ල ද මීට අයත් වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එල්. යූ. එන්. එන්. උමගිලිය මිය,
කළමනාකාරිණී.

2019 ජනවාරි මස 03 වැනි දින,
ලංකා බැංකුව,
කිරිබත්ගොඩ අධිශ්‍රේණි ශාඛාව.

02 - 162

---

**ලංකා බැංකුව**

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම**

2018.11.27 වැනි දින පවත්වන ලද රැස්වීමේදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එල්. එම්. පී. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2017.12.15 දිනැති අංක 1291 දරන උකස් බැඳුම්කරය සහ 2017.12.15 දිනැති අංක 1292 දරන උකස් බැඳුම්කර මත 2018.10.01 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් එක්කෝටි හතලිස් හතර ලක්ෂ අසූතුන්දහස් හයසිය හයයි ශත හතළිස් හතක (රු. 14,483,606.47) මුදල සමග කාලීන ණය මත රුපියල් එක්කෝටි විසිනව ලක්ෂ අනූ නව දහස් හාරසිය විසිපහයි ශත දහතුන (රු. 12,999,425.13) මුදලක් මත වසරකට සියයට දහසය (16%) බැගින් 2018.10.02 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොලිය ද, නුගේගොඩ, පාගොඩ පාරේ, 6 වන පටුමග, අංක 9/4 හි ඔප්නා ෆැෂන්ස් (තනි අයිතිකාරිය චමිලා වනිගසේකර මහත්මිය) වෙතින් අයවිය යුතු අතර 2018.10.01 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් එක්කෝටි පන්ලක්ෂ දෙදහස් හයසිය හැටඅටයි ශත තිස්හතර ක (රු. 10,502,668.34) මුදල සමග ලංකා බැංකු නිවාස ණය මත රුපියල් අනූහය ලක්ෂ පනස්හත් දහස් පන්සිය අසූහතරයි ශත අනූ හතර (රු.9,657,584.94) ක මුදල මත වසරකට සියයට දහහතර (14%) බැගින් 2018.10.02 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොලිය ද, නුගේගොඩ, පාගොඩ පාර, 6 වන පටුමග, අංක 9/4 හි චමිලා වනිගසේකර මහත්මිය සහ අමරකෝන් රාජපක්ෂ මොහොට්ටි මුදියන්සේලාගේ ලසන්ත රංජිව අමරකෝන් මහතා යන අය වෙතින් අයවිය යුතුව ඇත.

2. 2017.12.15 දිනැති අංක 1291 දරන උකස් බැඳුම්කරය සහ 2017.12.15 දිනැති අංක 1292 දරන උකස් බැඳුම්කර මත කාලීන ණය මත අයවිය යුතු රුපියල් එක්කෝටි හතලිස් හතර ලක්ෂ අසූතුන්දහස් හයසිය හයයි ශත හතලිස් හත (රු. 14,483,606.47) මුදල සහ ලංකා බැංකු නිවාස ණය මත අයවිය යුතු රුපියල් එක්කෝටි පන්ලක්ෂ දෙදහස් හසයිය හැට අටයි ශත තිස් හතරක (රු. 10,502,668.34) මුදල සමග 2018.10.02 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3, ටී ඇන්ඩ් එච් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුවේ, නුගේගොඩ අධිශ්‍රේණි ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමණාකරුහට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කොරලේ, පල්ලෙපත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභා සීමා තුළ පාගොඩ

අංක 519/ඒ දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පාගොඩ පිහිටි 6 වන පටුමගෙහි වරිපනම් අංක 7/20බී දරන "කෝන්ගහවත්ත දවටගහඹිවිට හා ඕවිටෙවත්ත" නැමති ඉඩමට එහි ඇති ගොඩනැගිලි ගහකොල සහ වගාවන් ඇතුළත්ව බලයලත් මිනින්දෝරු පී. එම්. සුනිල් විසින් සාදන ලද 2011 ඔක්තෝබර් මස 09 වැනි දිනැති අංක 1842 දරන පිඹුරෙහි ලොට් 1ඒ ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් ලොට් 1ඒ, උතුරට : පාර ද, නැගෙනහිරට : අංක 658ඒ දරන පිඹුරෙහි ලොට් 2සී ද, දකුණට : වරිපනම් අංක 9 දරන පරිශ්‍රය, 6 වන පටුමග ද, බස්නාහිරට : වරිපනම් අංක 9/8 දරන පරිශ්‍රය ද, 6 වන පටුමග ද මායිම් එකී අංක 1842 දරන පිඹුරට අනුව පර්චස් නවයක (අ. 0, රූ. 0, පර්. 09) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 442/71 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. පී. ඒ. අබේවික්‍රම මහතා,
ප්‍රධාන කළමනාකරු.

ලංකා බැංකුව,
නුගේගොඩ අධිශ්‍රේණි ශාඛාව.

02 - 150

---

**සෙලාන් බැංකුව පීඑල්සී - මරදාන ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව.

ගිණුම් අංකය : 0470 - 00489150 - 001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018.11.29 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් බී. ඒ. එම්. අයි. විජයවික්‍රම විසින් සහතික කරන ලද 2013, මාර්තු මස 5 වැනි දිනැති බැඳුම්කර අංක 4847 මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 11 පදිංචි සෙයඩ් මොහමඩ් මුජාහිඩ් හෙවත් සෙයියිද් මොහම්මද් මුජාහිද් යන අය බන්ධදායී වශයෙන් රුපියල් දෙකෝටි තුන්ලක්ෂ විසිඑක් දහස් දෙසීයයි ශත හතලිස් අටක (රු. 20,321,200.48) මුදලක් එකී බැඳුම්කරය මත පහත සඳහන් පහසුකම් සම්බන්ධයෙන් පොලිය සමග මුළු මුදලක් 2018 අගෝස්තු මස 02 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් එකී මුදල වන රුපියල් දෙකෝටි තුන්ලක්ෂ විසිඑක්දහස් දෙසීයයි ශත හතලිස් අටක (රු.20,321,200.48) මුදලක් 2018 අගෝස්තු මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා පහත සඳහන් පරිදි පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී බැඳුම්කර අංක 4847 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන, සංශෝධිත පරිදි, බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

(අ) ස්ථිර අයිරා පහසුකම සම්බන්ධයෙන් රුපියල් එක්කෝටි දෙලක්ෂ හැත්තෑ හතර දහස් නවසිය අසූඑකයි ශත තිහක (රු. 10,274,981.30) මුදලක් මත 2018 අගෝස්තු මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට විසිඅට (28%) බැගින් පොලිය සමග.

(ආ) කාලීන පහසුකම සම්බන්ධයෙන් රුපියල් අනූහත් ලක්ෂ පනස්දාහක (රු.9,750,00.00) මුදල මත අගෝස්තු 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා වසරකට සියයට විස්ස (20%) බැගින් පොලිය සමග රුපියල් එක්කෝටි හතලිස්හයදහස් දෙසිය දහනවයයි ශත දහඅටක මුදලක් (රු. 10,046,219.18).

**උපලේඛනය**

බස්නාහි පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ දෙල්කඳ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුල සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ. දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුල වෝඩ් අංක 4 කළුබෝවිල පිහිටි බලයලත් බලයලත් මිනින්දෝරු පී. බී. දොඩන්ගොඩ විසින් සාදන ලද 2005.12.13 දිනැති අංක 5837ඒ සැලැස්මේ නිරූපනය වන ප්‍රතිබිම්බාරාම පාර වරිපනම් අංක 11 දරන මාදන්ගහවත්ත නැමති ඉඩමේ ලොට් 2, ලෙස ලකුණු කර බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ප්‍රතිබිම්බාරාම පාර වරිපනම් අංක 15/ 1සී1 දරන පරිශ්‍රය ද, දකුණට : ප්‍රතිබිම්බාරාම පාර වරිපනම් අංක 11ඒ දරන පරිශ්‍රය සහ බස්නාහිරට : ප්‍රතිබිම්බාරාම පාර යන මායිම් තුල අංක 5837ඒ සැලැස්ම අනුව පර්චස් දහසයයි දශම බිංදුවයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 16.02) ක් විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

එකී ලොට් 02 පහත විස්තර කරනු ලබන ඉඩම් එකතු කිරීමෙන් පසු නැවත මැන සහ අතුරු බෙදන ලද කොටසක් වේ.

1. පෙරකී කළුබෝවිල පිහිටි බලයලත් මිනින්දෝරු සාලිය එම්. ඩබ්ලිව්. රත්නායක විසින් සාදන ලද 1995.06.04 දිනැති අංක 3342

සැලැස්මේ නිරූපනය වන මාදන්ගහවත්ත නැමති ඉඩමේ ලොට් 1 ලෙස ලකුණු කර බෙදාවෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් , උතුරට : රෝහල පාර වරිපනම් අංක 53 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : ප්‍රතිබිම්බාරාම පාර වරිපනම් අංක 15/1 දරන පරිශ්‍රය ද, දකුණට : අංක 566 සැලැස්මේ සඳහන් ලොට් 2 සහ බස්නාහිරට : මෙහි සඳහන් ලොට් 3 සහ 2 ද යන මායිම් තුළ අංක 3342 සැලැස්ම අනුව පර්චස් දහයයි දශම බිංදුවයි අටක් (අ. 0, රූ. 0, පර්. 10.08) ක් විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

2. පෙරකී කළුබෝවිල පිහිටි බලයලත් මිනින්දෝරු සාලිය එම්. ඩබ්ලිව්. රත්නායක විසින් සාදන ලද 1995.06.04 දිනැති අංක 3342 සැලැස්මේ නිරූපනය වන මාදන්ගහවත්ත නැමති ඉඩමේ ලොට් 2 ලෙස ලකුණු කර බෙදාවෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් , උතුරට : මෙහි සඳහන් ලොට් 3 ද, නැගෙනහිර : මෙහි සඳහන් ලොට් 1 ද, දකුණට : අංක 566 සැලැස්මේ සඳහන් ලොට් 2 සහ බස්නාහිරට : ප්‍රතිබිම්බාරාම පාර ද යන මායිම් තුළ අංක 3342 සැලැස්ම අනුව පර්චස් තුනයි දශම බිංදුවයි දෙකයි හතරක් (අ. 0, රූ. 0, පර්. 3.024) ක් විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

3. පෙරකී කළුබෝවිල පිහිටි බලයලත් මිනින්දෝරු සාලිය එම්. ඩබ්ලිව්. රත්නායක විසින් සාදන ලද 1995.06.04 දිනැති අංක 3342 සැලැස්මේ නිරූපනය වන මාදන්ගහවත්ත නැමති ඉඩමේ ලොට් 3 ලෙස ලකුණු කර බෙදාවෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ප්‍රතිබිම්බාර පාර වරිපනම් අංක 9 දරන පරිශ්‍රය සහ රෝහල පාර වරිපනම් අංක 53 ද, නැගෙනහිර : ලොට් 1 ද, දකුණට : මෙහි සඳහන් ලොට් 2 සහ බස්නාහිරට : ප්‍රතිබිම්බාරාම පාර ද යන මායිම් තුළ අංක 3342 සැලැස්ම අනුව පර්චස් පහලොවයි දශම බිංදුවයි නවයයි හයක් (අ. 0, රූ. 0, පර්. 15.096) ක් විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව් මිය.
නීති ප්‍රධානී.

02 - 142

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2018.11.27 වැනි දින පවත්වන ලද රැස්වීමේදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් දීප්ති වීරසූරිය විසින් සහතික කරන ලද 2013.01.03 වැනි දින අංක 2075 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. රණසිංහ විසින් සහතික කරන ලද 2014.04.29 දිනැති අංක 206 දරන උකස් බැඳුම්කරය මත 2018.10.01 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් එක්කෝටි හතලිස් දෙලක්ෂ හැත්තෑහය දහස් නවසිය හැට අටයි ශත අනූ එක (රු. 14,276,968.91) මුදල සමග ලංකා බැංකු නිවාස ණය මත රුපියල් එක්කෝටි විසිඅටලක්ෂ දොලොස් දහස් අටසිය අනූඑකයි ශත හැත්තෑ හය (රු. 12,812,891.76) ක මුදලක් මත වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) බැගින් තවදුරටත් පොලිය ද, 2018.10.01 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් හැටපන්ලක්ෂ අසූදහස් හාරසිය තිස්අටයි ශත තිස් හයක (රු. 6,580,438.36) මුදල සමග අයිරා පහසුකම රුපියල් ලක්ෂ හැටක (රු. 60,000,000.00) මුදල මත වසරකට සියයට දහසයයි දශම පහ (16.5%) බැගින් 2018.10.02 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොලිය ද, මොරටුව, මොරටුවැල්ල, 1 වෙනි ෆෙසර් ඇවනියු, අංක 5 හි ගමගේ බුද්ධික යසදුල් රණසිංහ මහතා සහ ගමගේ සැමී ෂෙල්ටන් රණසිංහ මහතා වෙතින් අයවිය යුතුව ඇත.

2. 2013.01.03 වැනි දිනැති අංක 2075 දරන උකස් බැඳුම්කරය සහ 2014.04.29 දිනැති අංක 206 දරන උකස් බැඳුම්කර මත ලංකා බැංකු නිවාස ණය මත අයවිය යුතු රුපියල් එක්කෝටි හතලිස් දෙලක්ෂ හැත්තෑහය දහස් නවසිය හැට අටයි ශත අනූ එක (රු. 14,276,968.91) මුදල සහ අයිරා පහසුකම මත අයවිය යුතු රුපියල් හැටපන් ලක්ෂ අසූදහස් හාරසිය තිස්අටයි ශත තිස්හය (රු. 6,580,438.36) මුදල සමග 2018.10.02 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 50/3, ටී ඇන්ඩ් එච් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධන වල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, මොරටුව අධිශ්‍රේණි ශාඛාවේ ප්‍රධාන කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරටුව මහ නගර සභා සීමාවේ සල්පිටි කෝරලේ, පල්ලෙ පත්තුවේ, මොරටුවැල්ල - දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මොරටුවැල්ල ග්‍රාමයෙහි පිහිටි ෆෙසර් ඇවනියු හි වරිපනම් අංක 21/4ඒ දරන "මාදංගහවත්ත, නුගගහවත්ත, ඇහැටුගහවත්ත සහ පෙන්සියාවත්ත" නැමති යාබද ඉඩම් කැබලි වලට බලයලත් මිනින්දෝරු සී. ඩබ්ලිව්. ද මෙල් විසින් සාදන ලද 1995 නොවැම්බර් මස 23 දිනැති අංක 1219ඒ දරන පිඹුරෙහි ලොට්

12 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 12, උතුරට : අඩි 15 පළල පාරට වෙන් කළ කොටසක් වන එම ඉඩමේ ලොට් 13 ද, නැගෙනහිරට : එම ඉඩමේ ලොට් 11 ද, දකුණට : එල්. ඊ. එස්. ඒබ්‍රහම් ද සිල්වා සහ එල්. ඊ. ග්ලැඩිස් ද සිල්වාගේ දේපළ ද, බස්නාහිරට : අඩි 30 පළල පාරට වෙන් කළ කොටසක් වන එම ඉඩමේ ලොට් 4 ද, මායිම්ව එකී අංක 1219ඒ දරන පිඹුරට අනුව පර්චස් විස්සයි දශම හතයි එකක (අ. 0, රූ. 0, පර්. 20.71) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 83/112 හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 12 පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි. එකී මොරටුවැල්ල ග්‍රාමයෙහි පිහිටි ෆෙසර් ඇවනියු හි වරිපනම් අංක 21/4ඒ දරන "මාදංගහවත්ත, නුගගහවත්ත, ඇහැටුගහවත්ත සහ පෙන්සියාවත්ත" නැමති යාබද ඉඩම් කැබලිවලට බලයලත් මිනින්දෝරු එම්. එම්. කුරේ විසින් සාදන ලද 1995 අගෝස්තු මස 29 දිනැති අංක 1275 දරන පිඹුරෙහි ලොට් 12 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 12, උතුරට : අඩි 13 (අඩි 15 පළල පාර) ද, නැගෙනහිරට : 1 වන පටුමගේ ෆෙසර් ඇවනියු හි වරිපනම් අංක 19/4ඒ වී. එම්. ප්‍රනාන්දුගේ දේපළ ද, දකුණට : 1 වන පටුමගේ ෆෙසර් ඇවනියු හි වරිපනම් අංක 7 ජී. එස්. එස්. රණසිංහගේ දේපල ද, බස්නාහිරට : 1 වන පටුමගේ ෆෙසර් ඇවනියු හි මායිම්ව එකී අංක 2175 දරන පිඹුරට අනුව පර්චස් විස්සයි දශම හතයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 20.70) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

### දෙවන උපලේඛනය

එකී මොරටුවැල්ල ග්‍රාමයෙහි පිහිටි "මාදංගහවත්ත, නුගගහවත්ත, ඇහැටුගහවත්ත සහ පෙන්සියාවත්ත" නැමති යාබද ඉඩම් කැබලි වල අංක 1219ඒ දරන එකී පිඹුරෙහි ලොට් 4, 12 හා 19 ලෙස දක්වා ඇති මාර්ගයෙහි අයිතිය සමඟ උතුරට : එම ඉඩමේ ලොට් 1, 2 හා 3 ද ටී. එම්. පීරිස්ගේ දේපල ද මාර්ගය එෆ්. ජේ. එල්වින් සිල්වාගේ සහ පී. ඇන්. එන්ග්‍රේෂියා ප්‍රනාන්දුගේ දේපළ ද, දකුණට : එම ඉඩමේ ලොට් 10, 11 සහ 12 සහ තවත් අයට අයිති දේපල සහ එල්. ඊ. ග්ලැඩිස් ද සිල්වා, එන්. ඩී. ඒම්ස් සහ තවත් අයට අයිති දේපළ සහ එම ඉඩමේ ලොට් 14, 15, 16 (අඩි පාර) 17 හා 18 ද, බස්නාහිරට : එම ඉඩමේ ලොට් 3 හා 14 සහ දුම්රිය පාරට වෙන් කරන ලද කොටස ද, මායිම් එකී අංක 1219ඒ දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් පහයි දශම අටයි තුනක (අ. 0, රූ. 01, පර්. 5.83) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D 149/14 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්.එල්. දයානන්ද මහත්මිය,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී.

ලංකා බැංකුව,
මොරටුව අධිශ්‍රේණි ශාඛාව.

02 - 151

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මඟින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

එන්. පී. පී. කේ. විජේරත්න සහ එන්. පී. සී. ටී. විජේරත්න.
ගිණුම් අංක : 0172 5000 0227.

සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2018.12.20 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02 ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. බන්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2015 අගෝස්තු මස 06 දාතම හා අංක 4573 දරන, 2017 අප්‍රේල් මස 06 දාතම හා අංක 5212 දරන සහ 2018 ජනවාරි මස 12 දාතම හා අංක 5542 දරන උකස් බැඳුම්කර සියල්ල මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නවරත්න පහලගෙදර ප්‍රදීප් කුමාර විජේරත්න සහ නවරත්න පහල ගෙදර චමින්ද තිලකසිරි විජේරත්න යන අය බන්ධදායි වශයෙන් හා එකී නවරත්න පහලගෙදර ප්‍රදීප් කුමාර විජේරත්න යන අය උකස්කරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4573, 5212 සහ 5542 දරන උකස් බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුළු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් තුන්කෝටි හැත්තෑ නම ලක්ෂ අසූ හත් දහස් අටසිය විසි හයයි ශත හැත්තෑ තුනක (රු. 37,987,826.73) මුදලක් 2018 දෙසැම්බර් මස 03 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තුන්කෝටි හැත්තෑ නම ලක්ෂ අසූ හත් දහස් අටසිය විසි හයයි ශත හැත්තෑ තුනක (රු. 37,987,826.73) මුදල ද, 2018 දෙසැම්බර් මස 04 වැනි දින සිට අංක 4573, 5212 සහ 5542 දරන එකී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් කෝටි හැට අට ලක්ෂ හතලිස් අට දහස් එකසිය අනූ හයයි ශත තුනක (රු. 36,848,196.03) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 4573, 5212 සහ 5542 දරන උකස් බැඳුම්කරය මඟින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ලිය

යුතු යැයි, 1990 අංක 04 දරන බැංකු මඟින් ප්‍රධානය කරන ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කන්තලේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ කන්තලේ නගරය - අංක 227 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කන්තලේ වෝඩ් අංක 6 අග්‍රබෝධි මාවත පිහිටි වරිපනම් අංක 70 දරන "කන්තලේකාඩු" යයි කියනු ලබන ඉඩමෙන් (කලින් අංක 85 දරන පිඹුරේ ලොට් 3245) බලයලත් මානක තැන කේ. සෙල්ලපිල්ලෙයි යන අය විසින් සාදන ලද 1997 අගෝස්තු මස 26 දාතම හා අංක 524 දරන පිඹුරේ නිරූපිත ලොට් "01" වශයෙන් ලකුණු කොට ඇති රජයේ ඉඩම් කොටසට මායිම්, උතුරට : FTP 2 හි ලොට් 3324 ද, නැගෙනහිරට : FTP 2 හි ලොට් 3188 වශයෙන් ලකුණු කොට ඇති පාර, දකුණට : ලොට් 2 සහ බස්නාහිරට : FTP 2 ලොට් 3324 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දහ අටයි දශම පහයි බිංදුවක් (A.0, R.3, P. 18.50) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමගය.

මෑත දී කරන ලද මිනුමකට අනුව ඉහත සඳහන් ඉඩම පහතින් විස්තර කොට ඇත :-

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ කන්තලේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ කන්තලේ නගරය - අංක 227 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කන්තලේ වෝඩ් අංක 6 අග්‍රබෝධි මාවත පිහිටි වරිපනම් අංක 70 දරන "කන්තලේකාඩු" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන මොහොමඩ් අන්වර් යන අය විසින් සාදන ලද 2013 ජුලි මස 24 දාතම හා අංක 1322 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් "01" වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : FTP 2 හි ලොට් 3324 ද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව සන්තක ඉඩම, නැගෙනහිරට : අග්‍රබෝධි මාවත (පාර), දකුණට : අංක 524 දරන පිඹුරේ ලොට් 2 සහ බස්නාහිරට : FTP 2 හි ලොට් 3324 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් දහ අටයි දශම පහයි බිංදුවක් (A.0, R.3, P. 18.50) හෝ හෙක්ටයාර් 0.3503 ක් විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1322 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව LDO/P/9/118 වෙත ගෙන යන ලද LD/KA/50/120 යටතේ ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්,

02 - 139

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංක පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 2165243.
පීටර් සේනක රොද්‍රිගෝ.

2018 නොවැම්බර් මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2017 සැප්තැම්බර් මස 12 වැනි දින සහතික කරන ලද අංක 3348 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි නමට ලියන ලද්දා වූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පීටර් සේනක රොද්‍රිගෝ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය යටතේ ඇමෙරිකානු ඩොලර් හය ලක්ෂ විසිපන් දහස් අටසිය දාහතයි ශත හතලිහක (ඇ. ඩො. 625,817.40) හෝ (ශ්‍රී ලංකා රුපියල් ඒ සමාන වන) මුදලක් 2018 ඔක්තෝබර් මස 17 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින්, එකී ඇමෙරිකානු ඩොලර් හය ලක්ෂ විසිපන් දහස් අටසිය දාහතයි ශත හතලිහක (ඇ. ඩො. 625,817.40) හෝ (ශ්‍රී ලංකා රුපියල් ඒ සමාන වන) මුදල අය කර ගැනීම සඳහා සහ 2018 ඔක්තෝබර් මස 18 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට ඇ.ඩො. 598,932 (හෝ ශ්‍රී ලංකා රුපියල් ඒ සමාන වන) ක මුදල මත වර්ෂයකට 7.3207% බැගින් (මාස තුන (03) LIBOR අගය + 5% වාර්ෂික පොළී අනුපාතයට) වැඩිදුර පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩු කොට එකී අංක 3348 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි උකස් කොට ඇත්තාවූද, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ස්ඩෝර්ෆ් වීදියේ 2 වැනි මහලේ, අංක 200 දරන ස්ථානයේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ මහ නගර සභා සීමා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත නාවල කොස්වත්ත 520 ඒ ග්‍රාම නිලධාරි වසමේ කොට්ඨාසය අංක 4, නාවල තුළ

කොස්වත්ත - නාවල පිහිටි චන්ද්‍රා වෙත්තසිංහ මාවතෙන් තුන්වන පටුමගේ වරිපනම් අංක 15/24 දරන (වර්තමානයේ වරිපනම් අංක 13/35 සහ 13/35 සහ 13/35 1/1) මීගහකුඹුර සහ වැලිකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. වෝල්ටර් ඩී. පෙරේරා විසින් 2010 සැප්තැම්බර් මස 21 වැනි දින මැන සාදන ලද අංක 010185 දරන පිඹුරෙන් වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් අංක 3918 දරන ලොට් 1ඒ හි ඉතිරි කොටස සහ පොළොව යට හියුම් පයිප්පයෙන් ද, නැගෙනහිරට : පොළොව යට හියුම් පයිප්පය සහ දියවන්නා ඔයෙන් ද, දකුණට : දියවන්නා ඔයෙන් සහ බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් අංක 3918 දරන පිඹුරේ ලොට් 3ඒ ඉතිරි කොටසෙන් සහ චන්ද්‍රා වෙත්තසිංහ මාවතෙන් තුන්වන පටුමගේ වරිපනම් අංක 15/24/1 න් ද, බස්නාහිරට : චන්ද්‍රා වෙත්තසිංහ මාවතෙන් තුන්වන පටුමගේ වරිපනම් අංක 15/24/1 න් සහ අඩි 20 පළල පාරෙන් ද මායිම් වූ එකී අංක 010185 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් බිංදුවයි පහයි දශම හතයි හයක (අ. 0, රූ. 1, පර්. 05.76) හෙවත් (හෙක්ටයාර් 0.11574) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැඟිලි සහ එහි පිහිටි සියළු දේත් සමඟ වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්‍රිරුව ඒ31/114 යටතේ ලියාපදිංචි කර ඇත.

සම්පූර්ණ නිදහස් අයිතිය සහ පිටවීමේ සහ ප්‍රතිගමනයේ බලය සහ මාර්ගය මතින් මාර්ගය පාරක් ලෙස භාවිතා වන පහත දක්වෙන ඉඩම් කොටස් :

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ඉහත කී පරිදි ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ මහ නගර සභා සීමා ඇතුළත කොස්වත්ත - නාවල හි පිහිටි මීගහකුඹුර නැමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් ආර් 1 (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : කොස්වත්ත නිවාස යෝජනා ක්‍රමය සහ කොස්වත්ත 3 වන පටුමග මඟින් ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් 1976.05.31 වැනි දින පිළියෙල කරන ලද අංක 3113 දරන පිඹුරේ ලොට් 6 න් සහ ලොට් 60 න් ද, දකුණට : ලොට්ස් 1, ආර් 2, 10, 20, 34, 35, 45, 46, 53, 54, ආර්6, 69 සහ ආර් 7 සහ ලොට් 60න් ද සහ බස්නාහිරට : රාදාගේ කුඹුරෙන් ද මායිම් වූ අංක 3113 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විසිපහයි දශම පහක (අ. 0, රූ. 1, පර්. 25.5) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම / පත්‍රිරුව ඒ 31/116 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ මහ නගර සභා සීමා ඇතුළත කොස්වත්ත - නාවල හි පිහිටි මීගහකුඹුර නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් ආර් 2 (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් ආර් 1 - අංක 3113 දරන පිඹුරේ පාර සඳහා වෙන් කිරීම, කොස්වත්ත නිවාස යෝජනා ක්‍රමය සහ කොස්වත්ත 3 වන පටුමග මඟින් ද, නැගෙනහිරට : අංක 2355ඒ දරන පිඹුරේ ලොට් සී හි කොටසෙන් ද, දකුණට : ලොට් 2 න් ද, සහ බස්නාහිරට : අංක 2355ඒ දරන පිඹුරේ ලොට් බී න් ද මායිම් වූ අංක 3113 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහසයයි දශම දෙකයි පහක (අ. 0, රූ. 0, පර්. 16.25) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම / පත්‍රිරුව ඒ 31/117 යටතේ ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ මහ නගර සභා සීමා ඇතුළත කොස්වත්ත - නාවල හි පිහිටි මීගහකුඹුර නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් ආර් 3 (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් ආර් 1 - අංක 3113 දරන පිඹුරේ පාර සඳහා වෙන් කිරීම ද, නැගෙනහිරට : අංක 2355ඒ දරන පිඹුරේ ලොට් බී හි කොටසෙන් ද, දකුණට : අංක 2355ඒ දරන පිඹුරේ ලොට් ඒ හි කොටසෙන් ද සහ බස්නාහිරට : පාර සඳහා ලොට් ආර් 2 වෙන් කිරීම මඟින් ද මායිම් වූ එකී අංක 3113 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහළොවයි (අ. 0, රූ. 0, පර්. 15) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම / පත්‍රිරුව ඒ31/118 යටතේ ලියාපදිංචි කර ඇත.

4. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ මහ නගර සභා සීමා ඇතුළත කොස්වත්ත - නාවල හි පිහිටි මීගහකුඹුර නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුන්ග විසින් 1985 ජනවාරි මස 23 වැනි දින අංක 2369 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2ඒ (අඩි 30 පළල පාර සඳහා වෙන්කිරීම) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 2355ඒ දරන පිඹුරේ ලොට් බී, අඩි 20 පළල පාර සඳහා ලොට් ආර් 2 වෙන් කිරීම කොටසෙන් ද සහ අංක 2355ඒ දරන පිඹුරේ ලොට් සී කොටසෙන් ද, නැගෙනහිරට : අඩි 30 පළල පාර සඳහා ලොට් 2සී 3 වෙන්කිරීම මඟින් ද, දකුණට : ලොට් 2බී න් ද සහ බස්නාහිරට : අඩි 20 පළල පාර සඳහා ලොට් 1 වෙන් කිරීම මඟින් ද සහ අංක 2355ඒ දරන පිඹුරේ එම ඉඩමේ ලොට් ඒ කොටසෙන් ද මායිම් වූ එකී අංක 2369 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම පහයි බිංදුවයි (අ. 0, රූ. 0, පර්. 20.50) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම / පත්‍රිරුව ඒ31/123 යටතේ ලියාපදිංචි කර ඇත.

5. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමා ඇතුළත කොස්වත්ත - නාවල හි පිහිටි මීගහකුඹුර නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුන්ග විසින් 1984 මැයි මස 05 වැනි දින පිළියෙල කරන ලද අංක 2311 දරන පිඹුරේ ලොට් 2සී හි උප බෙදුමක් වන) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුන්ග විසින් 1985 ජනවාරි මස 23 වැනි දින පිළියෙල කරන ලද අංක 2369 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2සී3 (අඩි 30 පළල පාර සඳහා වෙන් කිරීම) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 2355ඒ දරන පිඹුරේ ලොට් 2සී කොටසෙන් ද, නැගෙනහිරට : ලොට් 2සී2 න් ද, දකුණට : ලොට් 2සී1 න් ද සහ බස්නාහිරට : අඩි 20 පළල පාර සඳහා ලොට් 2ඒ වෙන් කිරීම මඟින් ද මායිම් වූ එකී අංක 2369 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාහතරක් (අ. 0, රූ. 0, පර්. 14) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම / පත්‍රිරුව ඒ 31/122 යටතේ ලියාපදිංචි කර ඇත.

6. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමා ඇතුලත කොස්වත්ත - නාවල හි පිහිටි මීගහකුඹුර සහ වැලිකුඹුර නමැති ඉඩමට බලයලත් ඩී. ඩී. හෙට්ටිගේ විසින් 2002 දෙසැම්බර් මස 03 වැනි දින මැන සාදන ලද අංක 3910 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් හය (අඩි 20 පළල පාර සඳහා වෙන් කිරීම) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට (ඒකාබද්ධ කිරීම මත නැවත මැනීම අර්ථ දක්වන ලද කොටසක් වන සහ බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග විසින් 1985 ජනවාරි මස 23 වැනි දින පිළියෙල කරන ලද අංක 2369 දරන පිඹුරේ ලොට් 2සී2 හි කොටසේ උපබෙදුම සහ බලයලත් මිනින්දෝරු ජී. බී. ගොඩන්වෙල විසින් 1992 පෙබරවාරි මස 18 වැනි දින අංක 893/92 දරන පිඹුරේ ලොට් 1 හි උපබෙදුමක් ලෙස අර්ථ දක්වන බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් 2002 නොවැම්බර් මස 10 වැනි දින පිළියෙල කරන ලද අංක 3902 දරන පිඹුරේ දැක්වෙන ලොට් 2ඩී1) මායිම් වශයෙන්, උතුරට : ලොට් 1 සහ 4 න් ද, නැගෙනහිරට : ලොට්ස් 1 - 5 න් ද, දකුණට : ලොට් 5 න් ද සහ බස්නාහිරට : අංක 2369 දරන පිඹුරේ ලොට් 2සී1න් ද සහ අංක 2369 දරන පිඹුරේ 2සී3 න් ද (අඩි 30 පළල පාර සඳහා වෙන් කිරීම) මායිම් වූ එකී අංක 3910 දරන පිඹුර ප්‍රකාරව පර්චස් තිහයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 30.3) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම / පත්ඉරුව ඒ31/120 යටතේ ලියාපදිංචි කර ඇත.

7. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමා ඇතුලත කොස්වත්ත - නාවල හි පිහිටි මීගහකුඹුර සහ වැලිකුඹුර නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් 2005 නොවැම්බර් මස 17 වැනි දින පිළියෙල කරන ලද අංක 2131 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට (නැවත මැනීමක් වන තව ද බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් 1962 ජනවාරි 21 වැනි දින පිළියෙල කරන ලද අංක 2855 දරන පිඹුරේ ලොට්ස් බී සහ සී හි කොටස්වල ඒකාබද්ධ කිරීමක් සහ ලොට්ස් 13 සහ 14) මායිම් වශයෙන්, උතුරට : අංක 2355ඒ දරන පිඹුරේ ලොට් බී හි කොටසෙන් ද, නැගෙනහිරට : ලොට් 2 න් ද, දකුණට : අංක 2355ඒ දරන පිඹුරේ ලොට් ඒ හි කොටසෙන් ද සහ බස්නාහිරට : අඩි 20 පළල පාර සඳහා වෙන් කිරීම අංක 3113 දරන පිඹුරේ ලොට් ආර් 3 (කොටස) න් ද, මායිම් වූ එකී අංක 2131 දරන පිඹුර ප්‍රකාරව පර්චස් බිංදුවයි දෙකයි දශම බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 02.0) විශාලත්වයෙන් වූ ඉඩම සමඟ වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම / පත්ඉරුව ඒ31/121 යටතේ ලියාපදිංචි කර ඇත.

8. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමා ඇතුලත කොස්වත්ත - නාවල හි පිහිටි මීගහකුඹුර සහ වැලිකුඹුර නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ඩී. හෙට්ටිගේ විසින් 2003 පෙබරවාරි මස 16 වැනි දින මැන සාදන ලද අංක 3918 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 2ඩී වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ලොට් $1^{A}$ න් ද, නැගෙනහිරට : ලොට් $2^{C}$ න් ද, දකුණට : ලොට් $2^{A}$ සහ $2^{B}$ ද සහ බස්නාහිරට : අඩි 20 පළල පාර සඳහා වෙන් කිරීම අංක 3910 දරන පිඹුරේ ලොට් 6 න් ද, මායිම් වූ එකී අංක 2235 දරන පිඹුර ප්‍රකාරව පර්චස් බිංදුවයි හයයි දශම හයයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 06.62) විශාලත්වයෙන් වූ ඉඩම සමග වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම / පත්ඉරුව ඒ31/119 යටතේ ලියාපදිංචි කර ඇත.

රංජනි ගමගේ මහත්මිය,
සමාගම් ලේකම්.

02 - 133

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | | *රු. ශ.* |
|---|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව | ... | ... | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | | ... | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | | ... | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | | ... | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) … … | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) … … | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) … … … … … … … … | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) … … … … … … … … | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)… … | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය… … … … … … … … | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය … … … … … … … | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) … … | 25 0 | 60 0 |
| III වැනි ඡේදය … … … … … … … | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) … … | 80 0 | 120 0 |
| II වැනි කොටස … … … … … … … … | 12 0 | 60 0 |
| III වැනි කොටස … … … … … … … … | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) … … … | 23 0 | 60 0 |
| V වැනි කොටස … … … … … … … … | 123 0 | 60 0 |
| VI වැනි කොටස … … … … … … … … | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2019** | | | |
| **පෙබරවාරි** | 2019.02.01 | සිකුරාදා | 2019.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.08 | සිකුරාදා | 2019.01.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.15 | සිකුරාදා | 2019.02.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.22 | සිකුරාදා | 2019.02.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2019.03.01 | සිකුරාදා | 2019.02.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.08 | සිකුරාදා | 2019.02.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.15 | සිකුරාදා | 2018.03.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.22 | සිකුරාදා | 2018.03.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.29 | සිකුරාදා | 2018.03.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2019.04.05 | සිකුරාදා | 2018.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.12 | සිකුරාදා | 2018.03.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.18 | බ්‍රහස්පතින්දා | 2019.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.25 | සිකුරාදා | 2019.04.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.